කඳුරට නව ගම්මාන, යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය

மலைநாட்டு புதிய கிராமங்கள், உட்கட்டமைப்பு மற்றும் சமூக அபிவிருத்தி அமைச்சு

Ministry of Hill Country New Villages, Infrastructure and Community Development



# කාර්යසාධනය (ප්‍රගතිය) 2017 සහ ඉදිරි වැඩසටහන්

## 2017-செயலாற்றுகை (முன்னேற்றம்) மற்றும் எதிர்கால நிகழ்ச்சித்திட்டங்கள்

# Performance (Progress) 2017 and Future Programmes

# කාර්යසාධනය (ප්‍රගතිය) 2017 සහ ඉදිරි වැඩසටහන්

# 2017-செயலாற்றுகை (முன்னேற்றம்) மற்றும் எதிர்கால நிகழ்ச்சித்திட்டங்கள்

# Performance (Progress) 2017 and Future Programmes

කඳුරට නව ගම්මාන, යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය

மலைநாட்டு புதிய கிராமங்கள், உட்கட்டமைப்பு மற்றும் சமூக அபிவிருத்தி அமைச்சு

Ministry of Hill Country New Villages, Infrastructure and Community Development

**කාර්යසාධනය (ප්‍රගතිය) 2017 සහ**
**ඉදිරි වැඩසටහන්**

2017 - செயலாற்றுகை (முன்னேற்றம்) மற்றும்
எதிர்கால நிகழ்ச்சித்திட்டங்கள்

**Performance (Progress) 2017 and**
**Future Programmes**


කඳුරට නව ගම්මාන, යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය
மலைநாட்டு புதிய கிராமங்கள், உட்கட்டமைப்பு மற்றும் சமூக அபிவிருத்தி அமைச்சு
Ministry of Hill Country New Villages, Infrastructure and Community Development

P.O. Box 562, No. 45, St. Michale’s Road, Colombo 03.
Tel: 0112 541 369 Fax : 0112 328 117
Email : smpid@sltnet.lk / mhplanning2016@gmail.com
Web site www.mhnv.gov.lk

Printed with VOC free, non toxic vegetable oil-based environmentally-friendly ink, on 100% recycled paper using wood free pulp which is made from 100% post consumer waste paper
*(Paper recycling is the process of recovering waste paper and remarking it into new paper products.)*

Recycling one ton of paper saves
17 mature trees, 26 m3 of water, 2.3 m3 of disposal space, 320 liters of oil, and 4,100 kilowatt-hours of electricity.

**We encourage you to recycle this document after use.**

Printed by Printec Establishment (Pvt)Ltd - www.printec.lk

# කඳුරට නව ගම්මාන, යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය

## කාර්යසාධනය (ප්‍රගතිය) 2017 සහ ඉදිරි වැඩසටහන්

# දැක්ම

වැවිලි ක්ෂේත්‍රයේ ප්‍රජාව,
අන් ජන කොටස් හා සමාන සමාජ තත්ත්වයකින්,
ආත්ම ගෞරවයකින් හා අභිමානයකින් හෙබි
ග්‍රාමීය ප්‍රජාවක් ලෙස පරිණාමනය කිරීම

# මෙහෙවර

වැවිලි අංශයේ ජනතාවගේ සුභසාධනය,
ඔවුන්ගේ වාසස්ථාන,
ජීවන තත්ත්වය
හා
සමාජ ආර්ථික පහසුකම්
වැඩි දියුණු කිරීම තුලින් ප්‍රවර්ධනය කිරීම



# පටුන


01. හැඳින්වීම

02. අමාත්‍යාංශය ස්ථාපිත කිරීම

03. අමාත්‍යාංශයේ සංවිධාන ව්‍යුහය හා තත්‍ය කාර්ය මණ්ඩලය

04. අමාත්‍යාංශයේ සංවර්ධන ප්‍රවේශය හා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ යාන්ත්‍රණය
   4.1. සංවර්ධන ප්‍රවේශය සහ ප්‍රමුඛතා
   4.2. ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ යාන්ත්‍රණය හා ආයතනික ව්‍යුහය

05. 2017 වසර සඳහා ප්‍රතිපාදන හා මූල්‍ය ප්‍රගතිය

06. සංවර්ධන වැඩසටහන් හා ප්‍රගතිය
   6.1. කඳුරට නව ගම්මාන සඳහා නිවාස
   6.2. පසුගාමී ප්‍රදේශ වල සමාජ ආර්ථික සංවර්ධනය
   6.3. ජීවනෝපාය සංවර්ධනය

07. අමාත්‍යාංශය විසින් 2017 වසරේ අත්පත් කර ගන්නා ලද විශේෂ ජයග්‍රහණ

08. අමාත්‍යාංශය යටතේ ඇති ආයතන
   8.1. වැවිලි මානව සංවර්ධන භාරය
   8.2. ප්‍රජාශක්ති මෙහෙයුම් ඒකකය

09. අමාත්‍යාංශයේ අපේක්ෂා හා 2018 ආයෝජනය

10. අමාත්‍යාංශයේ සංවර්ධන ක්‍රියාකාරකම් - ඡායාරූප



## කඳුරට නව ගම්මාන, යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන අමාත්‍ය
## ගරු පලනි දිගාම්බරම් මැතිතුමාගේ පණිවුඩය

කඳුරට නව ගම්මාන, යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය ස්ථාපනය කිරීමත් සමගම එතෙක් ලයින් කාමර වාසස්ථානය කර ගත් ප්‍රජාව තමන්ට අයත් වූ තනි නිවසක් හා නිරවුල් ඉඩමක අයිතිය උරුමකරගත් අභිමානවත් පුරවැසියන් බවට පත් කිරීමේ කාර්යභාරය ක්‍රියාවට නැංවූ අතර එය, ආර්ථික, සමාජයීය හා දේශපාලනික වශයෙන් වැවිලි ප්‍රජාව එතෙක් අත්වින්දා වූ හුදකලා බව බිඳ දැමීමේ ආරම්භ විය.

නව ගම්මාන සංකල්පය යටතේ වැවිලි ප්‍රජාව වෙත නිවාස ලබා දීම මෙම අමාත්‍යාංශය වෙත පැවරුනු ප්‍රධාන කර්තව්‍යයක් වන අතර නුවරඑළිය ආගරපතන වැවිලි සමාගමට අයත් ''හුට්විල්'' වතුයායේ ඉදි කරන ලද නව නිවාස ගම්මානය අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් 2017 පෙබරවාරි මස ජනතා අයිතියට පත් කරන ලදී. ඊට සමගාමීව එම නිවාස ප්‍රතිලාභීන් සඳහා නිරවුල් ඉඩම් ඔප්පු ප්‍රදානයද අරඹන ලදී. එය අඛන්ඩව ක්‍රියාවට නංවමින් ගරු අග්‍රාමාත්‍යතුමා විසින් ප්‍රතිලාභීන් 2864 ක් සඳහා නිරවුල් ඔප්පු ප්‍රදානය කිරීම 2017 ඔක්තොබර් මස හැටන්හීදී සිදු කරන ලද අතර එය ඉදිරියටත් ක්‍රියාත්මක වේ.

නිවාස වැඩසටහන සැලකිල්ලට ගත් කළ එහි ඉදිකිරීම් දේශීය අයවැය ප්‍රතිපාදන මත මෙන්ම ඉන්දියානු රජයේ ආධාර යටතේ ද සිදු කරනු ලබයි. ඉන්දියානු රජය විසින් මෙතෙක් ලබා දී ඇති නිවාස ඒකක 4,000 ට අමතරව තවත් නිවාස ඒකක 10,000 ක් ඉදිරි වසර වලදී ඉදි කිරීම සඳහා අනුග්‍රහය ලබා දී ඇත.

වැවිලි ප්‍රජාවගේ සමාජ සංවර්ධනය සඳහා වන පස් අවුරුදු ජාතික ක්‍රියාකාරී සැලැස්ම ප්‍රධාන වශයෙන් රජයේ මුදල් ප්‍රතිපාදන මත ක්‍රියාත්මක වන බැවින් එහි සඳහන් අනෙකුත් සංරචකයන් ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය විදේශීය අරමුදල් සම්පාදනය කර ගැනීම සඳහා ද අමාත්‍යාංශය විසින් ප්‍රයත්න දරමින් සටී. රැකියා වෙළඳපොල ඉලක්ක කර ගනිමින් රැකියා විරහිත තරුණයන් සඳහා අවශ්‍ය තාක්ෂණික පුහුණුව ලබා දීමට පුල් බැංක් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය සංවර්ධනය කිරීමට අපේක්ෂා කරන අතර

ඒ සඳහා ඉන්දියානු රජය විසින් රුපියල් මිලියන 199 ක ආධාර ලබා දී ඇත. නුපුහුණු රැකියාවන් වෙත අවතීර්ණ වී ඇති උගත් තරුණ පරපුර ඉන් මුදවා වඩාත් වැඩි වැටුප් ඉපයිය හැකි පුහුණු රැකියාවන් වෙත යොමු කිරීමට අවස්ථාව සලසා දීම අමාත්‍යාංශය මුහුණ පා ඇති විශාලතම අභියෝගයක් වී ඇත.

අමාත්‍යමණ්ඩල අනුමැතිය සඳහා ඉදිරිපත්කර ඇති ''නව ගම්මාන සංවර්ධන අධිකාරිය'' පිහිටුවීම තුළින් ජාතික ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාවට නැංවීමත් නව ගම්මාන පිහිටුවීම ක්‍රියාවට නැංවීමත් අපේක්ෂා කෙරේ. එමෙන්ම මේ හරහා දේශීය හා විදේශීය අරමුදල් සම්පාදනය කිරීමටත් අමාත්‍යාංශයේ ක්‍රියාන්විත ධාරිතාව පුළුල් කිරීමටත් සැලසුම් කෙරෙන අතර එමගින් සමාජ සංවර්ධන දර්ශක හා සැසඳීමේදී වඩාත් පීඩාවට හා හුදකලා බවට පත්ව ඇති මෙම වැවිලි ප්‍රජාව, අන් සමාජ කොටස් හා සමාන වරප්‍රසාද ලත් හා ජාතික පරිපාලන පද්ධතියට අනුගත වූ ජනකොටසක් බවට පත් කිරීමේ හැකියාව උදාවනු ඇත.

**පලනි තිගාම්බරම් (පා.ම.)**
කඳුරට නව ගම්මාන, යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන ගරු අමාත්‍ය



## කඳුරට නව ගම්මාන, යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය **ලේකම්තුමියගේ පණිවුඩය**

ශ්‍රී ලංකාව වර්ෂ 2025 දී සමෘද්ධිමත් සහ සම්පත්වලින් සපිරි දේශයක් බවට පත් කිරීම උදෙසා ශ්‍රී ලංකා රජය විසින් දුරදර්ශී වැඩපිළිවෙලකට අවතර්ණ වී ඇත. මෙම දුරදර්ශී වැඩ පිළිවෙල හරහා වැවිලි ප්‍රජාවගේ ජීවන තත්ත්වය ශ්‍රී ලංකාවේ වෙනත් ප්‍රජාවන්ට සමාන වන පරිදි වැඩි දියුණු කිරීමට අපේක්ෂා කෙරේ. ඔවුන්ගේ දරිද්‍රතාව ඉතා ඉහළ මට්ටමක පවතින අතර අධ්‍යාපනය, සෞඛ්‍යය හා පෝෂණය, නිවාස සහ පිරිසිදු පානීය ජලය සඳහා ඇති අවස්ථා යන ජීවන දර්ශකයන් නාගරික මට්ටමේ ජීවන දර්ශක සමග සංසන්දනය කරන විට පහළ අගයක පවතී. මේ තත්ත්වය වෙනස් කිරීම සඳහා කඳුරට නව ගම්මාන, යටිතල පහසුකම් සහ ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය විසින් වෙන්කරන ලද අරමුදල් භාවිත කරමින් සහස්‍ර සංවර්ධන අරමුණු සහ තිරසාර සංවර්ධන අරමුණු අත්පත් කර ගැනීමේ අරමුණින් වැවිලි ප්‍රජාවගේ සාමාන්‍ය ජීවිතය සහ ප්‍රජා සංවර්ධනයෙහි වැඩි දියුණු කිරීම් තහවුරු කිරීම සඳහා විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලැබේ. අප විසින් පසුගිය වර්ෂයේදී සකස් කරන ලද ජාතික ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව ප්‍රමුඛතාව හිමි ගැටලු සහ එම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කරනු ලැබේ. තවද, අප විසින් අදාළ සියලු අමාත්‍යාංශ සහ සංවිධාන සම්බන්ධීකරණය කර ගැනීම තුළින් ජාතික ක්‍රියාකාරී සැලැස්ම මගින් නියම කර ඇති අරමුණු ළඟා කර ගැනීම සඳහා දැනටමත් අවශ්‍ය පියවර ගෙන ඇත.

2017 වර්ෂයේ පෙබරවාරි මස 09 වන දින, අතිගරු ජනාධිපතිතුමාගේ සුරතින් පළමුවෙන්ම හුට්විල් යන නව ගම්මානය උත්සවාකාරයෙන් ජනතා අයිතියට පත් කෙරිනි. එම අවස්ථාවේදී ප්‍රතිලාභීන් 71 දෙනෙකුට නිවාස සම්බන්ධයෙන් නිරවුල් ඉඩම් ඔප්පු පිරිනැමීම වැවිලි ක්ෂේත්‍ර ඉතිහාසයේ රන් අකුරින් ලියැවෙනු නොඅනුමානය. එසේම, රජය විසින් වෙන් කරන ලද අරමුදල් මගින් 2010 සිට 2016 වර්ෂය දක්වා ඉදිකරන ලද සියලු නිවාස සඳහා නිරවුල් ඉඩම් ඔප්පු ලබාදීම සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගෙන තිබීම සුවිශේෂී ජයග්‍රහණයකි. සාම්ප්‍රදායික ලයින් කාමර නිවාස බවට පත් කිරීම පමණක් නොව රෝහල් සඳහා ප්‍රවේශ මාර්ග ඉදිකිරීම, සෙසු මහා මාර්ග, අධ්‍යාපන

පහසුකම්, සෞඛ්‍යය හා ක්‍රීඩා පහසුකම් වැඩි දියුණු කිරීම මෙන්ම පූජනීය ස්ථාන සහ සමූපකාර සමිති ආදිය ඉදිකිරීම හා වැඩි දියුණු කිරීම හරහා වඩා යහපත් ජීවන පරිසරයක් නිර්මාණය කිරීමද අප අමාත්‍යාංශයෙන් ඉටු කෙරෙන මෙහෙවර තුළ අන්තර්ගත වේ.

වර්ෂ 2017 සැප්තැම්බර් මස තෙක් කඳුරට නව ගම්මාන, යටිතල පහසුකම් සහ ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය විසින් පවත්වාගෙන යන ලද ව්‍යාපෘති සහ මෙම වර්ෂය අවසන් වීමට පෙර සම්පූර්ණ කළ යුතු ව්‍යාපෘති මෙම කාර්ය සාධන වාර්තාවෙහි ඉදිරිපත් කර ඇත.

මෙම අමාත්‍යාංශයේ කටයුතු සඳහා ආදර්ශමත් නායකත්වයක් සහ මාර්ගෝපදේශකත්වයක් සපයනු ලබන සහ ජාතික සංවර්ධන ක්‍රියාවලිය තුළ වතු ප්‍රජාවට කිසිවකුට නොදෙවනි වන තත්ත්වයක් තහවුරු කිරීම සඳහා වතු ප්‍රජාවගේ සංවර්ධන ක්‍රියාවලිය කඩිනම් කිරීමට ව්‍යාපෘති නිර්මාණය කරනු ලබන ගරු අමාත්‍ය පලනි දිගාම්බරම් මැතිතුමා හට මාගේ අවංක ස්තුතිය පුද කිරීමට මම කැමැත්තෙමි. එසේම, ප්‍රතිපත්තිමය වශයෙන් වැවිලි ප්‍රජාවගේ ජීවිත තුළ ධනාත්මක වෙනසක් ඇති කිරීමේ අරමුණින් ක්‍රියාකරනු ලබන අතිගරු ජනාධිපතිතුමාට සහ ගරු අග්‍රාමාත්‍යතුමාට ද මාගේ විශේෂ ස්තුතිය පුදකරමි. එසේම ලබා දෙන ලද සහයෝගය වෙනුවෙන් අනෙකුත් ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ටද මාගේ ස්තුතිය පිරිනමමි. තවද, අප අමාත්‍යාංශ නිලධාරීන්ගෙන්, වැවිලි මානව සංවර්ධන භාරයේ නිලධාරීන්ගෙන්, පළාත්, දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය මට්ටමේ නිලධාරීගෙන් අප අමාත්‍යාංශයීය වැඩසටහන් කාර්යක්ෂමව හා සාර්ථකව ක්‍රියාත්මක කිරීමෙහිලා ලැබෙන සහයෝගය හා ඔවුන්ගේ කැපවීම සම්බන්ධයෙන් එම සියලු දෙනාටම මාගේ විශේෂ ප්‍රශංසාව සහ කෘතඥතාව පළ කරනු කැමැත්තෙමි. වැවිලි ප්‍රජාවගේ ජීවන තත්ත්වය නගා සිටුවීමට අප සැම එක්ව ක්‍රියාකරමි.

**රංජිනි නඩරාජාපිල්ලෙයි**
**ලේකම්**



# 01

## හැඳින්වීම

ශතවර්ෂ දෙකකට ආසන්න ඉතිහාසයකට උරුමකම් කියනු ලබන ශ්‍රී ලංකාවේ වැවිලි ප්‍රජාවගේ මූලාරම්භය, මෙරට බ්‍රිතාන්‍යයේ යටත් විජිත යුගයක්ව පැවති සමය දක්වා පැතිර යයි. බ්‍රිතාන්‍යයන් විසින් වර්ෂ 1840 දී කඳුකරයේ කෝපි වගා කිරීම සඳහා, කම්කරුවන් ලෙස දකුණු ඉන්දියාවෙන් ගෙන්වා ගනු ලැබූ මෙම ජන කොට්ඨාශය, කෝපි වගාව විනාශවීමෙන් අනතුරුව ඇතිකල තේ හා රබර් වගාවන් කේන්ද්‍ර කර ගනිමින් සුවිශේෂී හුදකලා ජන කොටසක් ලෙස වර්ධනය වී ඇත.

ලැයින් කාමර සහිත පේළි නිවාස සිය වාසස්ථාන කොට ගනිමින්, ඉතා දිළිඳු කම්කරු ජීවන රටාවකට හිමිකම් කියන මොවුන්, මානව සංවර්ධන දර්ශක (නාගරික හා ග්‍රාමීය) හා සැසඳීමේදී, අන් ජන කොටස් වලට සාපේක්ෂව කැපී පෙනෙන සමාජ විෂමතාවකට ලක්ව ඇති බව පෙනී යයි. සමාජ සංවර්ධන දර්ශක හා සසඳා බැලීමේදී, ඔවුන්ගේ දර්ශකයන් ජාතික මට්ටමේ සමාජ සංවර්ධන දර්ශකයනට වඩා පහළ අගයක් ගනී.

ශ්‍රී ලංකාවේ මුළු ජනගහනයෙන් 5% ක් පමණ, වතු ප්‍රජාව නියෝජනය කරනු ලබයි. වැවිලි අංශය ආශ්‍රිතව මිලියන 1.1 පමණවන ජනගහනයක්, සෘජුව හා වක්‍රව එම ක්ෂේත්‍රයේ නියැලී සිටින්නේ තමන් සතුව එක් බිම් අඟලක හෝ නීත්‍යානුකූල අයිතියක් නොමැතිවය.

## වතු ක්ෂේත්‍රය පිළිබඳ මූලික දත්ත ( කුඩා තේ වතු හැර)

### 1. ඉඩම් පිළිබඳ විස්තර

- වතු සමාගම් සංඛ්‍යාව - 23
- වතු සංඛ්‍යාව- 453
- මුළු ඉඩම් ප්‍රමාණය - හෙක්ටයාර් 280,034
    - තේ හෙක්ටයාර් 80,637
    - රබර් හෙක්ටයාර් 45,881
    - පොල් හෙක්ටයාර් 9,482
    - වගා නොකරන ලද බිම් ප්‍රමාණය හෙක්ටයාර් 117,275

(මූලාශ්‍රයː- Annual Health Return, වැ.මා.සං.භා., 2014)

### 2. ජනගහන තොරතුරු

- මුළු ජනගහනය 999,166
- මුළු පවුල් සංඛ්‍යාව 256,545

| දිස්ත්‍රික්කය | නුවරඑළිය | බදුල්ල | මහනුවර | රත්නපුර | ගාල්ල | කෑගල්ල | එකතුව |
|---|---|---|---|---|---|---|---|
| ජනගහනය | 446,458 | 184,862 | 128,918 | 113,037 | 64,336 | 59,561 | 997,166 |
| පවුල් සංඛ්‍යාව | 113,745 | 48,359 | 33,000 | 28,998 | 17,047 | 15,396 | 256,545 |

## 3. නිවාස, ජලය හා සනීපාරක්ෂක පහසුකම්

| නිවාස - වර්තමාන තත්ත්වය | | |
|---|---|---|
| සංවර්ධනය කරන ලද නිවාස | 35,027 | 13.6 % |
| යුගල නිවාස | 28,062 | |
| තනි ඒකක නිවාස | 73,539 | |
| ද්විත්ව නිවාස | 69,613 | |
| තාවකාලික නිවාස | 13,814 | |
| මහල් පේළි නිවාස | 1,270 | |
| නිවාස අවශ්‍යතාවය | 221,518 | 86.4% |

මූලාශ්‍රය :- Annual Health Return, වැ.මා.සං.භා., 2016

| සනීපාරක්ෂක පහසුකම් - වර්තමාන තත්ත්වය | | |
|---|---|---|
| මුළු පවුල් සංඛ්‍යාව | 256,545 | |
| දැනට පහසුකම් ලබන පවුල් සංඛ්‍යාව | 138,257 | 53.9 % |
| වැසිකිළි අවශ්‍යතාව පවුල් සංඛ්‍යාව | 118,288 | 46.1 % |

| ජල පහසුකම් - වර්තමාන තත්ත්වය | | |
|---|---|---|
| මුළු පවුල් සංඛ්‍යාව | 256,545 | |
| දැනට පහසුකම් ලබන පවුල් සංඛ්‍යාව | 142,765 | 55.6% |
| ජල පහසුකම් අවශ්‍ය පවුල් සංඛ්‍යාව | 113,780 | 44.4% |

## 4. සෞඛ්‍ය හා පෝෂණය

ග්‍රාමීය, නාගරික, හා ජාතික මට්ටම් වලට සාපේක්ෂව වයස අවු. 5 ට අඩු වතු අංශයේ ළමයින්ගේ පෝෂණ තත්ත්වය

| ජනගහන සෞඛ්‍ය සමීක්ෂණය - 2016 / 2017 | | | | |
|---|---|---|---|---|
| දර්ශක | වතු අංශය % | ග්‍රාමීය % | නාගරික % | ජාතික % |
| අවුරුදු 5 ට අඩු ළමයි | | | | |
| මිටිබව | 31.7 | 17.0 | 14.7 | 17.3 |
| අඩු බර | 29.7 | 20.8 | 16.4 | 20.5 |
| කෘෂබව | 13.4 | 15.6 | 12.9 | 15.1 |

මූලාශ්‍රය :- ජනගහන සෞඛ්‍ය සමීක්ෂණ වාර්තාව 2016/2017.



# 02

# අමාත්‍යාංශය ස්ථාපිත කිරීම

## 2.1. පසුබිම:

එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් විශ්ව ප්‍රකාශයේ 25 වෙනි වගන්තිය, සිවිල් හා දේශපාලනික අයිතිවාසිකම් පිළිබඳ අන්තර් ජාතික සම්මුතියේ 17, 23 හා 24 වගන්ති මෙන්ම ආර්ථික, සාමාජීය සහ සංස්කෘතික අයිතිවාසිකම් පිළිබඳ අන්තර් ජාතික සම්මුතියේ 11 (1) වගන්තියට අනුව ආහාර, ඇඳුම්, නිවාස, සෞඛ්‍ය සේවා හා ආරක්ෂාවද, අවශ්‍ය සමාජසේවා ආරක්ෂාවද ඇතිව, තමන්ගේත් තම පවුලේත් සෞඛ්‍යයට හා යහපතට ප්‍රමාණවත් ජීවන තත්ත්වයක් භුක්ති විඳීමටත්, තම පාලනයෙන් බැහැර ආපදා හේතුවෙන්, ජීවිකාව දුෂ්කර වූ විට රැකවරණය ලැබීමටත්, පූර්ණ මනුෂ්‍යයෙකු බිහිවීම සඳහා අවශ්‍ය පෞද්ගලිකත්වය, හා පෞද්ගලික අවකාශය භුක්ති විඳීමටත්, සෑම මනුෂ්‍යයෙකුටම හිමිකමක් හා අයිතියක් ඇත.

ශ්‍රී ලංකාවද සිය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 10,11,13 හා 14 වගන්ති මගින්, මෙම අයිතිවාසිකම් තහවුරු කරමින් සියළු ජන කොටස් වෙත මෙකී සියළුම මූලික සේවාවන් සහ පහසුකම් භුක්ති විඳීමේ අයිතිය තහවුරු කරලීමේ භාරදූර වගකීම දශක ගණනාවක් තිස්සේ ක්‍රියාවට නංවමින් සිටී.

දකුණු ඉන්දියාවෙන් සංක්‍රමණිකයන් ලෙස පැමිණ මධ්‍යම, ඌව, සබරගමුව සහ දකුණු පළාත් හි ප්‍රදේශවලට සීමාවෙමින්, හුදකලාව ඔවුන්ටම ආවේනික සමාජ, ආර්ථික සහ සංස්කෘතික කොටසක් ලෙස විකාශය වූ වැවිලි ප්‍රජාව, බ්‍රිතාන්‍ය යටත් විජිත යුගයේ පටන්ම සිය මූලික අවශ්‍යතාවයන් උදෙසා වතු කළමණාකාරීත්වය මත යැපීම හේතුවෙන් රජය මගින් සපයනු ලබන මූලික සේවාවන් භුක්ති විඳීමේ අවස්ථාව මෙම ප්‍රජාව වෙත හිමිවූයේ ඉතා අල්ප මට්ටමකිනි.

එහි ප්‍රතිඵලය වී ඇත්තේ ශත වර්ෂ දෙකකට ආසන්න කාලයක් තිස්සේ ශ්‍රී ලංකාවේ ජාතික ආදායමට සුවිශාල දායකත්වයක් සපයනු ලැබූ මෙම ශ්‍රමික ප්‍රජාවට උක්ත වරප්‍රසාද ලඟාවීම ප්‍රමාද වීමයි. එබැවින්, රාජ්‍ය හා පෞද්ගලික දෙඅංශයන්හි පවතින නීති රාමුවන්ගේ ඇති ඇතැම් නොගැලපීම් හේතුවෙන් පෞද්ගලික වතු සමාගම් යටතේ ජීවිකාවේ නියැලී සිටින මිලියනයකට ආසන්න ජන කොටස් වෙත නිසි සේවාවන් සැපයීමේ ඇති දුෂ්කරතා මගහැර, මෙම ප්‍රජාවගේ සමාජ සංවර්ධනය ප්‍රශස්ත මට්ටමකට නැංවීම සඳහා සුවිශේෂිත වූ යාන්ත්‍රණයක් ඇති කිරීමේ අවශ්‍යතාවය දැඩිව මතුවිය.

## 2.2. අමාත්‍යාංශය ස්ථාපනය කිරීම

ඒ අනුව, වැවිලි ප්‍රජාව මෙතෙක් මුහුණ දුන් සමාජ විෂමතාවයන් තුරන්කොට අන් ජන කොටස් හා සමාන සමාජ තත්ත්වයකින්, ආත්ම ගෞරවයකින් හා අභිමානයකින් හෙබි ග්‍රාමීය ප්‍රජාවක් ලෙස පරිණාමනය කිරීමේ අදිටනින්, නව ප්‍රවේශයකින්, නව රජයේ ආරම්භයත් සමඟ 2015.09.25 දින ප්‍රකාශයට පත් කරන ලද අංක 1933/13 දරන අති විශේෂ ගැසට් පත්‍රය මගින් කඳුරට නව ගම්මාන, යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය පිහිටුවන ලදී.

## 2.3. ප්‍රධාන කාර්යභාරය

**01** රජයේ හා පෞද්ගලික වැවිලි සමාගම්වල සේවය කරන ඉඩම් අහිමි පේළි නිවාසවල ජීවත්වන ජනතාව සඳහා නිවාස හා යටිතල පහසුකම් සංවර්ධනය කිරීම උදෙසා නව ගම්මාන / නගර නිර්මාණය කිරීම.

**02** වතු අංශයේ ප්‍රජාව සවිබල ගැන්වීම සඳහා ජීවනෝපාය උත්පාදන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.

**03** වැවිලි ප්‍රජාව ආර්ථිකව, සාමාජීයව හා සංස්කෘතිකමය වශයෙන් නගාසිටුවීම සඳහා මූලික පහසුකම් ඇතුළු අනෙකුත් අවශ්‍යතා සම්පූර්ණ කිරීමට පියවර ගැනීම.

**04** ග්‍රාමීය වතු අංශයන්හි යටිතල පහසුකම් සංවර්ධනය කිරීම.




## 2.4. කාර්යභාරය ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍යාංශය යටතේ ඇති ආයතන

- වැවිලි මානව සංවර්ධන භාරය
- ප්‍රජා ශක්ති මෙහෙයුම් ඒකකය

1. පූල් බැන්ක් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය - හැටන්
2. සංස්කෘතික මධ්‍යස්ථානය - රම්බොඩ
3. නෝර්වුඩ් ක්‍රීඩා සංකීර්ණය
4. ප්‍රජාශක්ති (ඊ - කියෝස්ක්) මධ්‍යස්ථාන

# 03 අමාත්‍යාංශයේ සංවිධාන ව්‍යුහය

## 3.1 අමාත්‍යාංශ කාර්ය මණ්ඩලයේ සංවිධාන ව්‍යුහය



## 3.2 අමාත්‍යාංශයේ අනුමත හා තත්‍ය කාර්ය මණ්ඩලය (2017.09.30 දිනට)

| අනු අංක | තනතුර | සේවය | ශ්‍රේණිය/ පංතිය | අනුමත කාර්ය මණ්ඩලය | | තත්‍ය කාර්ය මණ්ඩලය | |
|---|---|---|---|---|---|---|---|
| | | | | ස්ථිර | තාවකාලික | ස්ථිර | තාවකාලික |
| 1. | ලේකම් | | | 1 | - | 1 | - |
| 2. | අතිරේක ලේකම් | ශ්‍රී.ලං.ප.සේවය | විශේෂ | 2 | - | 2 | - |
| 3. | ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් | ශ්‍රී.ලං.ප.සේවය | I පන්තිය | 1 | - | 1 | - |
| 4. | අධ්‍යක්ෂ | ශ්‍රී.ලං.ප.සේවය | I පන්තිය | 1 | - | 1 | - |
| 5. | අධ්‍යක්ෂ | ශ්‍රී.ලං.ක්‍ර.සේවය | I පන්තිය | 1 | | 1 | - |
| 6. | අධ්‍යක්ෂ | ශ්‍රී.ලං.ඉ.සේවය | I පන්තිය | 1 | - | - | - |
| 7. | ප්‍රධාන ගණකාධිකාරී | ශ්‍රී.ලං.ග.සේවය | I පන්තිය | 1 | - | 1 | - |
| 8. | ප්‍රධාන අභ්‍යන්තර විගණක | ශ්‍රී.ලං.ග.සේවය | I පන්තිය | 1 | - | 1 | - |
| 9. | සහකාර ලේකම් | ශ්‍රී.ලං.ප.සේවය | II/ III පන්තිය | 1 | - | - | - |
| 10. | සහකාර අධ්‍යක්ෂ | ශ්‍රී.ලං.ප.සේවය | II/ III පන්තිය | 2 | - | 1 | - |
| 11. | සහකාර අධ්‍යක්ෂ | ශ්‍රී.ලං.ක්‍ර.සේවය | II/ III පන්තිය | 2 | - | 2 | - |
| 12. | සහකාර අධ්‍යක්ෂ | ශ්‍රී.ලං.ඉ.සේවය | II/ III පන්තිය | 1 | - | 1 | - |
| 13. | ගණකාධිකාරී | ශ්‍රී.ලං.ග.සේවය | II/ III පන්තිය | 1 | - | 1 | - |
| 14. | පරිපාලන නිලධාරී | රා.කළ.සහ. සේවය | අධි ශ්‍රේණිය | 1 | - | 1 | - |
| 15. | භාෂා පරිවර්තක | භාෂා පරිවර්තක සේවය | II/ II පන්තිය | 2 | - | - | - |
| 16. | සංඛ්‍යා ලේඛන නිලධාරී | | | 1 | - | - | - |
| 17. | තාක්ෂණික නිලධාරී | ශ්‍රී.ලං.තා. සේ | I/ II/ III පන්තිය | 3 | - | - | 2 |
| 18. | සංවර්ධන නිලධාරී | සං.නිල.සේ | I/ II/ III පන්තිය | 14 | - | 14 | - |
| 19. | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර | ශ්‍රී.ලං.තො.හා. සං. | 3 - III/ II/ I | 1 | - | - | - |
| 20. | ලේකම්ගේ සංම්බන්ධීකරන ලේකම් | තාවකාලික | | - | 1 | - | 1 |
| 21. | රාජ්‍ය කළමණාකරන සහකාර | රා.කළ.සහ. සේවය | I/ II/ III පන්තිය | 20 | - | 12 | 1 |
| 22. | වැවිලි ප්‍රජා සන්නිවේදන පහසුකම් සලසන්නා | අමාත්‍යාංශගත | | 255 | - | 183 | - |
| 23. | නිශ්චල ඡායාරූප ශිල්පි | තාවකාලික | | 0 | 1 | - | 1 |
| 24. | වීඩියෝ කැමරා ශිල්පි | තාවකාලික | | 0 | 1 | - | 1 |
| 25. | කැමරා පුද්ගලික සහායක | තාවකාලික | | 0 | 1 | - | 1 |
| 26. | රියදුරු | ඒකාබද්ධ රියදුරු සේවය | I/ II/ III විශේෂ | 12 | - | 12 | - |
| 27. | කාර්යාල කාර්ය සහායක | කා.සේවක සේවය | I/ II/ III විශේෂ | 12 | 1 | 7 | - |
| | එකතුව | | | 337 | 5 | 242 | 7 |

## 3.3 අංශයන් හා කාර්යයභාරයන්

### ලේකම් අංශයඃ

අමාත්‍යාංශයේ ප්‍රධානියා මෙන්ම ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා ද වශයෙන් කටයුතු කරන ලේකම්තුමිය යටතේ ලේකම් අංශය ක්‍රියාත්මක වන අතර, එම අංශය වෙත පැවරී ඇති විශේෂ කටයුතු ක්‍රියාත්මක කිරීමත්, අමාත්‍යාංශයේ අනෙකුත් අංශ අතර සම්බන්ධීකරණය පවත්වා ගැනීමත්, රැස්වීම් සංවිධානය, වෙනත් අමාත්‍යාංශ හා විදේශීය ආයතන ආදිය සම්බන්ධීකරණයත් මෙම අංශය මගින් මූලික වශයෙන් සිදු කරනු ලබයි.

### පාලන අංශයඃ

වැවිලි මානව ප්‍රජාව සඳහා අමාත්‍යාංශය විසින් දියත් කරනු ලබන ව්‍යාපෘති ඉලක්ක ගත වකවානු වලට අවසන් කිරීම සඳහා අවශ්‍ය අමාත්‍යාංශයේ සංවිධාන ව්‍යුහය සැකසීම, නව තනතුරු ඇති කිරීම, නිලධාරීන් බඳවා ගැනීම, පුහුණු කිරීම ඇතුළු අමාත්‍යාංශයේ මානව සම්පත් සංවර්ධනය හා මෙහෙයවීම පාලන අංශයේ මූලික කාර්යභාරය වේ. එයට අමතරව

- අමාත්‍යාංශයේ සාමාන්‍ය පරිපාලනය
- නිලධාරීන්ගේ ස්ථාන මාරු සම්බන්ධයෙන් කටයුතු කිරීම හා අදාල අනෙකුත් ආයතනික කටයුතු සිදු කිරීම
- පෞද්ගලික ලිපි ගොනු පවත්වා ගැනීම
- කාර්ය මණ්ඩල තොරතුරු යාවත්කාලීන කිරීම හා අදාළ ආයතන වෙත බෙදා හැරීම
- වාහන සංචිතය පවත්වාගෙන යාම, වාහන නඩත්තුව
- අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ පවතින ආයතන අතර සම්බන්ධීකරණය, අනෙකුත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු සමඟ සම්බන්ධීකරණය
- ආයතන සංග්‍රහය, මුදල් රෙගුලාසි, චක්‍රලේඛ හා වෙනත් අණපනත් අනුව කාර්ය මණ්ඩලය මෙහෙය වීම යනාදී ක්‍රියාදාමයන් පාලන අංශය විසින් සිදු කරනු ලබයි.

### මානව සම්පත් සංවර්ධනය සඳහා අමාත්‍යාංශය විසින් 2017 සැප්තැම්බර් දක්වා ලබා දී ඇති පුහුණු වැඩසටහන්

#### දේශීය

| | පුහුණු පාඨමාලාව | ආයතනය | හැදෑරූ සංඛ්‍යාව |
|---|---|---|---|
| 01 | CIGAS | මිලෝදා | 1 |
| 02 | Diploma in English | ශ්‍රී ලංකා පරිපාලන සංවර්ධන ආයතනය | 1 |
| 03 | Payroll | මිලෝදා | 1 |
| 04 | National Diploma in English | ශ්‍රී ලංකා පදනම | 1 |
| 05 | IT Skills for Non IT Officers | මිලෝදා | 4 |
| 06 | Occupational Safety & Health Management | එලදායීතා ලේකම් කාර්යාලය | 1 |
| 07 | රථ වාහන හා යන්ත්‍රසූත්‍ර පාලනය | ජාතික ශ්‍රම අධ්‍යන ආයතනය | 1 |
| 08 | විද්‍යාත්මක හා පිරිමැසුම්දායක හා ආරක්ෂාකාරී රිය පැදවීම | ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ පුහුණු මධ්‍යස්ථානය | 6 |

| | | | |
|---|---|---|---|
| 09 | පෞද්ගලික ලිපි ගොණුවක් ඵලදායීව පවත්වාගන්නේ කෙසේද | ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය | 3 |

**විදේශීය**

| රට | | පුහුණු පාඨමාලාව | ආයතනය | හැදෑරූ සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 01 | චීනය | 2017 Seminar on Livelyhood & Social Development for Developing Countries | විදේශ සම්පත් දෙපාර්තමේන්තුව | 2 |
| 02 | චීනය | 2017 Seminar on Urbanization Construction & Planning for the Belt & Road Countries | විදේශ සම්පත් දෙපාර්තමේන්තුව | 1 |
| 03 | ඉන්දුනීසියාව | PIM International Programme in Management at Universitas Gadjah Mada | පශ්චාත් උපාධි කළමනාකරණ ආයතනය | 1 |
| 04 | මැලේසියාව | Capacity Building Training Programme | ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය | 1 |

**සංවර්ධන අංශයඃ**

වැවිලි අංශයේ ජනතාවගේ සුභ සාධනය, ඔවුන්ගේ වාසස්ථාන, ජීවන තත්ත්වය හා සමාජ ආර්ථික පහසුකම් වැඩි කිරීම උදෙසා අමාත්‍යාංශය, සංරචක 05 ක් යටතේ සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබන අතර අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ පවතින ආයතන, දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල හා ප්‍රාදේශීය සභා ඔස්සේ මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක කරනු ලබයි. මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක කරවීම හා සම්බන්ධීකරණය පිළිබඳ සියළු වගකීම් දරමින් රජයේ ඒකාබද්ධ අරමුදලින් හා ඉන්දියානු රජයේ සහායයන් යටතේ ලබා දෙන ලද අරමුදල් ද යොදවමින් අමාත්‍යාංශයේ අරමුණු හා ඉලක්ක කරා මෙහෙයවීමේ කාර්යභාරය සංවර්ධන අංශය මගින් සිදු කරනු ලබයි. පහත සඳහන් ක්‍රියාකාරකම් ඇතුළුව, ඉහත කර්තව්‍යයන් නිසිලෙස ක්‍රියාත්මක කිරීම සඳහා ඉංජිනේරු අංශයෙන්ද සුවිශාල දායකත්වයක් ලැබේ.

- ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කිරීම, ක්ෂේත්‍ර චාරිකා පැවැත්වීම හා අදාල ගෙවීම් නිර්දේශ කිරීම, මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සැකසීම.
- ඉංජිනේරු ඇස්තමේන්තු සැකසීම, ව්‍යාපෘති මාර්ගෝපදේශන සැකසීම හා අදාල අමාත්‍ය මණ්ඩල සංදේශ සැකසීම.
- ප්‍රජාශක්ති අධීක්ෂණ ඒකකය, ප්‍රජාශක්ති මධ්‍යස්ථාන, පූල් බැන්ක් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය, රම්බොඩ සංස්කෘතික මධ්‍යස්ථානය හා නෝර්වුඩ් ක්‍රීඩා සංකීර්ණය පරිපාලනය.
- පූල් බැන්ක් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය නවීකරණය කිරීම.

**සංවර්ධන අංශයේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන් හා වෙන්කල ප්‍රතිපාදනඃ**

| | වැය විෂය අංකය (140-2-4) | වැඩ සටහන | වෙන්කල ප්‍රතිපාදන ( රු. මි. ) | |
|---|---|---|---|---|
| | | | දේශීය | ඉන්දියානු ආධාර |
| 01 | 1 - 2506 | ජීවනෝපාය සංවර්ධනය | 100 | - |
| 02 | 2 - 2506 | පසුගාමී ප්‍රදේශයන්හි සමාජ ආර්ථික සංවර්ධනය | 500 | - |

| | | | | |
|---|---|---|---|---|
| 03 | 3 - 2506 | වතු නිවාස සංවර්ධනය (කඳුරට නව ගම්මාන සඳහා නිවාස ඉදි කිරීම) | 2,000 | - |
| 04 | 4 - 2506 | ඉන්දියානු රජයේ ආධාර මත හැටන් පූල් බැන්ක් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය සංවර්ධනය | 12 | 120 |
| 05 | 5 - 2506 | ඉන්දියානු රජයේ ආධාර යටතේ ඉදිකරනු ලබන නිවාස වැඩසටහන | 154 | 1,134 |
| | | | 2,766 | 1,254 |

### සැළසුම් අංශයː

අමාත්‍යාංශයේ අරමුණු සාක්ෂාත් කර ගැනීම උදෙසා ප්‍රධාන වශයෙන් පහත කර්තව්‍යයන් සැළසුම් අංශය මගින් ඉටු කරයි.

- සංවර්ධන ප්‍රතිපත්ති සැකසීමේදී සහාය ලබාදීම හා අමාත්‍යාංශයීය වාර්ෂික ක්‍රියාකාරී සැළැස්ම සැකසීම,
- අමාත්‍යාංශයේ සංවර්ධන කටයුතු ක්‍රියාත්මක කිරීමට අදාල ප්‍රාග්ධන ඇස්තමේන්තු සැකසීම
- ජාතික ක්‍රියාකාරී සැලස්ම ක්‍රියාවට නැංවීම හා එයට අදාල ආයතන සම්බන්ධීකරණය
- නව සංවර්ධන ව්‍යාපෘති හඳුනාගැනීම, ව්‍යාපෘති යෝජනා සැකසීම හා අමාත්‍ය මණ්ඩල සංදේශ සැකසීම
- ව්‍යාපෘති මෙහෙයවීම හා ඇගයීම, ක්ෂේත්‍ර නිරීක්ෂණය, ප්‍රගති සමාලෝචනය, ප්‍රගති වාර්තා සැකසීම හා අදාළ ආයතන වෙත යොමු කිරීම
- වෙබ් අඩවිය ප්‍රතිව්‍යුහගත කිරීම
- අමාත්‍යාංශයේ කාර්යසාධන වාර්තා සකස් කොට පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරිම
- මෙතෙක් විශාල අඩුපාඩුවක්ව පැවැති වැවිලි ක්ෂේත්‍රය පිළිබඳ තොරතුරු ලබාගැනීම සඳහා දත්ත සැකසුම් පද්ධතියක් සැකසීම, දත්ත එක්රැස් කිරීම හා යාවත්කාලීන කිරීම

### ගිණුම් අංශයː

අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති ආයතන සඳහා අවශ්‍ය භාණ්ඩ හා සේවා ප්‍රසම්පාදන ක්‍රියාවලිය මගින් ලබාදීම, වැටුප් හා දීමනා ගෙවීම, සංවර්ධන ක්‍රියාවලියන්ට අදාල ගෙවීම් කිරීම, නඩත්තු කටයුතු ආදී රාජ්‍ය අරමුදල් මගින් සිදු කරනු ගෙවීම් සම්බන්ධ සියළු කටයුතුවල වගකීම දරනු ලබන්නේ ගිණුම් අංශය මගිනි.

### අභ්‍යන්තර විගණන අංශයː

අමාත්‍යාංශයේ මූල්‍ය කටයුතු පිළිබඳව පවත්නා අභ්‍යන්තර පාලන ක්‍රමය පිළිබඳව ඇගයීම් සිදු කරමින් අඩුපාඩු වැලැක්වීම සහ අනාවරණය කර ගැනීම සඳහා භාවිතා කරනු ලබන අභ්‍යන්තර පරීක්ෂාවන්හි විධිමත් බව හා ප්‍රමාණවත් බව පිළිබඳව අඛණ්ඩ ඇගයීමකට ලක් කිරීමත්, වාර්ෂික ප්‍රතිපාදන මත ඉටු කරනු ලබන සංවර්ධන ව්‍යාපෘති සහ යෝජනාක්‍රම ක්‍රියාත්මක කිරීම පිළිබඳව ප්‍රගතිය නිශ්චය කිරීමට සහායවීමත්, ප්‍රගති සමාලෝචන රැස්වීම් වලදී අදාල කරුණු අනාවරණය කිරීමත්, විගණන අංශය විසින් මූලික වශයෙන් ඉටු කරනු ලබයි.

# 04

# අමාත්‍යාංශයේ සංවර්ධන ප්‍රවේශය හා ප්‍රමුඛතා

## 4.1. සංවර්ධන ප්‍රවේශය සහ ප්‍රමුඛතා

වැවිලි ප්‍රජාව මෙතෙක් මුහුණ දුන් සමාජ විෂමතාවයන් තුරන්කොට ඔවුන් අභිමානවත් ග්‍රාමීය ප්‍රජාවක් ලෙස පරිණාමනය කිරීමේ අරමුණින් ආරම්භ කල මෙම කඳුරට නව ගම්මාන, යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය, වැවිලි ප්‍රදේශ කේන්ද්‍ර ගත කරගනිමින් ජීවත් වන පවුල් 2,50,000 ක පමණ (මිලියනයකට අධික ජනගහණයක් ඇති) වතු ජනතාවගේ සමාජ, ආර්ථික සංවර්ධනය නිසි දිශානතියක් ඔස්සේ හා මනා අධීක්ෂණයකින් යුතුව සිදු කිරීම සඳහා, පස් අවුරුදු ජාතික ක්‍රියාකාරී සැලැස්මක් (2016-2020) සකස් කොට එය ක්‍රියාවට නංවා ඇත.

එමගින් ප්‍රමුඛතාව ලබා දී ඇති නිවාස, පානීය ජලය හා සනීපාරක්ෂක පහසුකම්, සෞඛ්‍ය හා පෝෂණය, අධ්‍යාපනය හා මුල් ළමාවිය සංවර්ධනය, වෘත්තීය පුහුණුව හා නිපුණතාවය, ප්‍රජාව සවිබල ගැන්වීම යනාදී ක්ෂේත්‍රයන් නියෝජනය කරනු ලබන අනෙකුත් රේඛීය අමාත්‍යාංශ, පළාත් අමාත්‍යාංශ ඇතුළු සියලුම ආයතනයන්හි පූර්ණ දායකත්වය ලබාගනිමින් වැවිලි ප්‍රජාවගේ සමාජ ආර්ථික සංවර්ධනය ශක්තිමත් කිරීම සඳහා, පැවරී ඇති සංවර්ධන කාර්යභාරයන් නොපිරිහෙලා ඉටු කිරීමට මෙම අමාත්‍යාංශය කැපවීමෙන් කටයුතු කරමින් සිටී.



# අමාත්‍යාංශයේ ප්‍රමුඛතා




## පසුගාමී ප්‍රදේශයන්හි සමාජ ආර්ථික සංවර්ධනය

- ජේලි නිවාසවල වහල නැවත සෙවිලි කිරීම
- පානීය ජලය සැපයීම, සනීපාරක්ෂක පහසුකම් සැපයීම
- ළමා සංවර්ධන මධ්‍යස්ථාන සංවර්ධනය
- අනෙකුත් යටිතල පහසුකම් සංවර්ධනය, විශේෂ ව්‍යාපෘති



## කඳුරට නව ගම්මාන සඳහා නිවාස ඉදි කිරීම

- හරිත රන් නිවාස
- ඉන්දියානු ආධාර සහිත නිවාස
- ප්‍රතිලාභී මූලික නිවාස වැඩසටහන



## ජීවනෝපාය සංවර්ධනය

- නිපුනතා සංවර්ධනය හා වෘත්තීය පුහුණුව
- ප්‍රජා සවිබල ගැන්වීම
- සෞඛ්‍ය හා පෝෂණය

## 4.2. සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ යාන්ත්‍රණය හා ආයතනික ව්‍යුහය


### ක්‍රියාත්මක කිරීමේ යාන්ත්‍රණය

අමාත්‍යාංශය මගින් මෙහෙයවනු ලබන සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ කාර්යභාරය මූලික වශයෙන් අමාත්‍යාංශ විෂය පථය යටතේ ඇති ආයතනයන් වන වැවිලි මානව සංවර්ධන භාරය, ප්‍රජාශක්ති මෙහෙයුම් මධ්‍යස්ථානය හරහා ද ඊට අමතරව දිස්ත්‍රික්/ප්‍රාදේශීය ලේකම් කාර්යාල හා ප්‍රාදේශීය සභා මගින් ද සිදු කරනු ලබයි.

### ප්‍රමුඛතා ක්ෂේත්‍රයන් හා ක්‍රියාත්මක කිරීමේ ආයතනික ව්‍යුහය

| ප්‍රමුඛතා ක්ෂේත්‍රය | ක්‍රියාත්මක කරනු ලබන ආයතනය |
|---|---|
| **(1) කඳුරට නව ගම්මාන සඳහා නිවාස ඉදි කිරීම**<br>(i) හරිත රන් නිවාස<br>(ii) ඉන්දියානු ආධාර සහිත නිවාස<br>(iii) ප්‍රතිලාභී මූලික නිවාස වැඩසටහන | වැවිලි මානව සංවර්ධන භාරය (PHDT) UNHABITAT, ජාත්‍යන්තර රතු කුරුස සංවිධානය, ජාතික නිවාස සංවර්ධන අධිකාරිය, මානව ජනාවාස සංවිධානය, වතු සේවක නිවාස සමූපකාර සමිතිය හා නිවාස ප්‍රතිලාභීන් |
| **(2) පසුගාමී ප්‍රදේශයන්හී සමාජ, ආර්ථික සංවර්ධනය**<br>(i) පේලි නිවාසවල වහල නැවත සෙවිලි කිරීම<br>(ii) පානීය ජලය සැපයීම<br>(iii) සනීපාරක්ෂක පහසුකම් සැපයීම<br>(iv) ළමා සංවර්ධන මධ්‍යස්ථාන සංවර්ධනය<br>(v) අනෙකුත් යටිතල පහසුකම් සංවර්ධනය (ප්‍රවේශ මාර්ග/විදුලිය)<br>(vi) විශේෂ ව්‍යාපෘති (ආගමික/ සංස්කෘතික) | වැවිලි මානව සංවර්ධන භාරය, (PHDT) දිස්ත්‍රික් / ප්‍රාදේශීය ලේකම් කාර්යාල හා ප්‍රාදේශීය සභා. |
| **(3) ජීවනෝපාය සංවර්ධනය**<br>(i) නිපුණතා සංවර්ධනය හා වෘත්තීය පුහුණුව<br>(ii) ප්‍රජා සවිබල ගැන්වීම<br>(iii) සෞඛ්‍ය හා පෝෂණය | පුල් බැන්ක් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය හා ප්‍රජාශක්ති සංවර්ධන මධ්‍යස්ථාන වැවිලි මානව සංවර්ධන භාරය, ප්‍රාදේශීය වෛද්‍ය නිලධාරී කාර්යාල හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල / දිස්ත්‍රික් ලේකම් කාර්යාල හා "වැවිලි ප්‍රජා සන්නිවේදන පහසුකම් සලසන්නා නිලධාරීන්" මගින් |

# ක්‍රියාත්මක කිරීමේ ආයතනික ව්‍යුහය



# 05

## 2017 වසර සඳහා ප්‍රතිපාදන හා මූල්‍ය ප්‍රගතිය

### 2017 වර්ෂය සඳහා ප්‍රතිපාදන වෙන් කිරීම

| කාණ්ඩය/ වැඩසටහන/ විෂයය | පුනරාවර්තන රු. '000 | ප්‍රාග්ධන රු. '000 | එකුතව රු. '000 |
|---|---|---|---|
| අමාත්‍ය කාර්යාලය | 24,350 | 2,500 | 26,850 |
| අමාත්‍යාංශ පරිපාලනය හා ආයතනික සේවා | 311,026 | 10,010 | 321,036 |
| ග්‍රාමීය ප්‍රජා සංවර්ධනය | | | |
| 1. ග්‍රාමීය ප්‍රදේශයන්හි ජීවනෝපාය සහ මූලික පහසුකම් වැඩි දියුණු කිරීම | | 100,000 | 100,000 |
| 2. පසුගාමී ප්‍රදේශයන්හි සමාජ ආර්ථික සංවර්ධනය | | 500,000 | 500,000 |
| 3. වතු නිවාස සංවර්ධනය (කඳුරට නව ගම්මාන සඳහා නිවාස) | | 1,000,000 | 1,000,000 |
| (අයවැය යෝජනා ද ඇතුලත්ව) | | 1,000,000 | 1,000,000 |
| 4. හැටන් පූල් බැන්ක් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය වැඩි දියුණු කිරීම | | | |
| (13) | | 120,000 | 120,000 |
| (17) | | 12,000 | 12,000 |
| 1. ඉන්දීය රජයේ ආධාර මත සිදුකරන නිවාස වැඩසටහන | | | |
| (13) | | 1,134,000 | 1,134,000 |
| (17) | | 154,000 | 154,000 |
| වෙන්කර ඇති මුළු ප්‍රතිපාදන | 3,35,376 | 40,32,510 | 43,67,886 |

## 2017 ජනවාරි - සැප්තැම්බර් 30 දිනට අමාත්‍යාංශයේ වියදම් සාරාංශය

| කාණ්ඩය / වැඩසටහන / විෂයය | 2017 සඳහා ප්‍රතිපාදන (රු: '000) | 2017.09.30 දිනට වියදම (රු: '000) | වියදම් ප්‍රතිශතය % |
|---|---|---|---|
| **පුනරාවර්තන** | 335,376 | 223,091 | 67 |
| පුද්ගල පඩිනඩි | 235,350 | 155,320 | 66 |
| ගරු අමාත්‍ය කාර්යාලය | 13,050 | 10,165 | 78 |
| අමාත්‍යාංශ පරිපාලනය | 222,300 | 145,155 | 65 |
| | | | |
| සාමාන්‍ය පරිපාලනය | 100,026 | 67,771 | 68 |
| ගරු අමාත්‍ය කාර්යාලය | 11,300 | 6,820 | 60 |
| අමාත්‍යාංශ පරිපාලනය | 88,726 | 60,952 | 69 |
| | | | |
| **ප්‍රාග්ධන** | 4,032,510 | 781,882 | 19 |
| සාමාන්‍ය පරිපාලනය | 12,510 | 6,202 | 50 |
| ගරු අමාත්‍ය කාර්යාලය | 2,500 | 1,744 | 70 |
| අමාත්‍යාංශ පරිපාලනය | 10,010 | 4,458 | 45 |
| | | | |
| සංවර්ධන වැඩසටහන් | **4,020,000** {*(13 - 1,254,000, **17 - 2,766,000)} | 839.192 | **30.34 |
| අ. ජීවනෝපාය හා මූලික පහසුකම් වැඩි දියුණු කිරීම | 100,000 | 26.280 | 26.28 |
| ආ. පසුගාමී ප්‍රදේශවල සමාජ ආර්ථික සංවර්ධනය | 500,000 | 106.570 | 21.34 |
| ඇ. කඳුරට නව ගම්මාන සඳහා නිවාස | 2,000,000 | 699.90 | 35.0 |
| ඈ. ප්‍රජාශක්ති වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය වැඩි දියුණු කිරීම | *13 - 120,000 | | - |
| | **17 - 12,000 | | |
| ඉ. ඉන්දියානු රජයේ ආධාර යටතේ ඉදිකරනු ලබන නිවාස වැඩ සටහන | *13 - 1,134,000 | | |
| | **17 - 154,000 | 6,442 | 4.18 |





# 06

# සංවර්ධන වැඩසටහන් හා ප්‍රගතිය

## 6.1. කඳුරට නව ගම්මාන සඳහා නිවාස

වාසස්ථාන සම්බන්ධයෙන් වන දර්ශක සැලකීමේදී ද වඩාත් පසුබෑමකට ලක්ව ඇති ජන කොට්ඨාශය ලෙස වැවිලි ප්‍රජාව සැලකිය හැක. වැවිලි ප්‍රජාව ජීවත් වන නිවාස වලින් 58% කට අධික ප්‍රමාණයක් පේළි නිවාස වන අතර එම නිවාස "ලයින් කාමර" වශයෙන් හඳුන්වනු ලබයි. (ජාතික මට්ටමින් ගත්කල මෙවැනි නිවාසයන්හි ප්‍රතිශතය 3.8%කි). මීට ශතවර්ෂ දෙකකට පමණ පූර්ව කාලයකදී බ්‍රිතාන්‍ය වතු පාලකයින් විසින් වතු සේවකයින් සඳහා ඉදි කරන ලද ඉතා පැරණි මෙම පේළි නිවාස බොහොමයක් වර්තමානය වනවිට ඉතා අබලන් තත්ත්වයකට පත්ව ඇත. හිරු එළිය හා වාතාශ්‍රය අවම වීම, අධික තදබදය, පෞද්ගලිකත්වයක් නොමැති වීම, අනු පවුල් බිහිවීම නිසා පවුල් කිහිපයකට එක් කාමරයක් තුල ජීවත් වීමට සිදුවීම මෙන්ම විවිධ වූ අපචාරයන්ට ගොදුරු වීම, අනාරක්ෂිත බව, සමාජ පිළිගැනීමක් නොමැති වීම සෞඛ්‍යයට හා ළමුන්ගේ අධ්‍යාපනයට නුසුදුසු වටපිටාවක් වීම ඇතුළු බොහෝමයක් සමාජයයීය ගැටලු මෙමගින් නිර්මාණය වී ඇත.

වැවිලි ක්ෂේත්‍රය තුල පවතින මෙවැනි නිවාස වර්ග තුනකට අයත් වේ.

1. **තනි බැරැක්ක** (Single line Houses)
   ඉදිරිපස ආලින්දයක් සහිත තනි කාමරයකින් සමන්විතය. ආලින්දය 5x5 $ft^2$ වන අතර මුළු නිවස 145 $ft^2$ ක් පමණ වේ. වැවිලි ක්ෂේත්‍රය තුල මෙවැනි පේළි නිවාස 11,599 ක් පමන හඳුනාගෙන ඇත. ඊට නිවාස ඒකක 73,539 ක් පමණ ඇතුලත් වී ඇති අතර ඒවායෙහි පවුල් 81, 900 කට අධික ප්‍රමාණයක් ජීවත් වේ.

2. **යුගල බැරැක්ක** (Double Line Houses)
   යුගල බැරැක්ක ඉදිරිපස ආලින්දයක් සහිතය පේළියකට කාමර 10 - 12 ක් තිබිය හැක. මෙහි පවුල් 02 ක් ජීවත් වේ. බිම් වර්ග ප්‍රමාණය 145 - 175 $ft^2$ පමණ වේ. දැනට මෙවැනි නිවාස 5,468 ක් හඳුනාගෙන ඇති අතර ඊට නිවාස ඒකක 69,613 ක් ඇතුලත් වී ඇත. පවුල් 76, 305 ක් පමණ මෙම නිවාසවල ජීවත් වන බව හඳුනාගෙන ඇත.


3. **තාවකාලික නිවාස**
   වැවිලි ක්ෂේත්‍රය තුල ක්‍රමිකව පවුල් සංඛ්‍යාව වර්ධනය වීමත් සමඟ පවතින පේළි නිවාස ප්‍රමාණය එම ක්ෂේත්‍රයේ ශ්‍රමිකයන්ට ප්‍රමාණවත් නොවූ බැවින්, පවතින පේළි නිවාසවලට යාබදව ඉඩ ඇති ස්ථානවල තාවකාලික නිවාස ඉදිකර ඇත. ටකරන් තහඩු සහ ඉටිරෙදි යොදා තනා ඇති මෙම නිවෙස් ඉතා අඩු පහසුකම් වලින් යුක්තය. වතු ක්ෂේත්‍රයේ මෙවැනි තාවකාලික නිවාස 13,814 ක් තුල පවුල් 14, 500 අධික ප්‍රමාණයක් ජීවත් වේ.

තොරතුරු මූලාශ්‍රයඃ (වැවිලි මානව සංවර්ධන භාරයේ දත්ත සමීක්ෂණ වාර්තා, 2016 )

වාසස්ථාන සම්බන්ධයෙන් වැවිලි ප්‍රජාව අත් විඳින්නා වූ දුෂ්කරතා මග හරවා අභිමානයකින් යුතුව ජීවත්වීමේ අයිතිය වැවිලි ප්‍රජාව වෙත ද හිමි කර දීමේ අභිලාශයෙන්, රජය විසින් ගනු ලැබූ ප්‍රතිපත්තිමය තීරණයක් මත පදනම්ව ආරම්භ කරන ලද "වතු නිවාස සංවර්ධන වැඩ සටහන" 2015

වර්ෂයට පෙර "නව ජීවන නිවාස වැඩසටහන" ලෙසද, 2015 වර්ෂය තුල රජයේ දින 100 වැඩසටහනට සමගාමීව විශේෂ ව්‍යාපෘතියක් ලෙසද ක්‍රියාත්මක වූ අතර 2016 වර්ෂයේ සිට "හරිත රන්'' නිවාස වැඩසටහන"ලෙස ක්‍රියාවට නැංවින. පර්චස් 07 ක ඉඩකඩක වර්ග අඩි 550 ක වපසරියකින් යුතු පානීය ජලය, විදුලිය හා සනීපාරක්ෂක පහසුකම් සහිත "තනි නිවාස ඒකක" ලබා දීමේ මෙම වැඩසටහන කඳුරට නව ගම්මාන, යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය විසින් අඛන්ඩව ක්‍රියාත්මක කරමින් පවතින අතර "පස් අවුරුදු ජාතික ක්‍රියාකාරී සැලැස්ම" අනුව යමින් 2020 වසර අවසන් වන විට තම අයිතියට වෙන් වූ පර්චස් 07 ක බිම් කඩක් සහිතව නිවාස ඒකක 56,500 ක් වැවිලි ප්‍රජාව වෙත හිමිකර දීම මෙම අමාත්‍යාංශයේ අපේක්ෂාව වේ. නව නිවාස ඉදි කිරීම සඳහා 2016.12.31 දින වනවිට රු.මි. 1,099 ක මුදලක් මෙම අමාත්‍යාංශය විසින් වැය කර ඇත. එමෙන්ම, 2017 වසරේ දී රජයේ ප්‍රතිපාදන හා ඉන්දියානු රජයේ පූර්ණ සහාය මත නිවාස යෝජනා ක්‍රම 3 ක් අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක කරනු ලබන අතර ඒ සඳහා රජයේ අරමුදල් වශයෙන් රු.මි. 2,154 ක් සහ ඉන්දියානු ආධාර වශයෙන් රු.මි. 1,134 ක් වෙන් කරනු ලැබ ඇත. 2017.09.30 දිනට නිවාස වැඩසටහනේ මූල්‍ය ප්‍රගතිය රු.මි. 700 කි. නාය යාමට ලක්වූ හා නාය යාමේ අවදානමක් සහිත වතු ආශ්‍රිත ප්‍රදේශවල ජීවත් වන ජනතාවට ප්‍රමුඛත්වය ලබා දෙමින් වතු සේවක පවුල් සඳහා මෙම නව නිවාස ලබාදීම සිදු කරනු ලබන අතර ඊට සමගාමීව ඒ සඳහා අවශ්‍ය යටිතල පහසුකම්, එනම් පානීය ජලය, විදුලිය සහ පිවිසුම් මාර්ග ලබාදීමේ ව්‍යාපෘතිද ක්‍රියාවට නැංවේ.

එමෙන්ම, වතු ජනතාව වෙත ඉඩම් අයිතිය හිමිකරදීමේ අභිලාෂයෙන් නව රජය විසින් ගත් ප්‍රතිපත්තිමය තීරණයක් මත නිවාස ප්‍රතිලාභීන් සඳහා නිරවුල් ඉඩම් ඔප්පු ලබා දීම සංකේතවත් කරමින් 2017-02-09 දින හැටන්හි දී අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් ප්‍රතිලාභී පවුල් 71 ක් සඳහා නිරවුල් ඔප්පු ලබාදීම සිදු කරන ලද අතර 2017.09.30 දින වන විට නිරවුල් ඔප්පු 446 ක් ලබා දී ඇත. තවදුරටත් ඔප්පු 6,624 ලබා දීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇත.



## 6.1.1. "හරිත රන්" නිවාස යෝජනා ක්‍රමය (Green Gold)
### ගම්මාන /නගර සංකල්පය යටතේ - (Village/ Township Concept)

### 2017 වර්ෂයේ ආරම්භ කරන ලද නිවාස

රජයේ මූල්‍ය ප්‍රතිපාදන මත අරඹන ලද "හරිත රන්" නිවාස යෝජනා ක්‍රමය යටතේ 2017.09.30 දින වනවිට නිවාස 2,466 ඉදිකිරීම් සඳහා අමාත්‍යාංශය විසින් අනුමැතිය ලබා දී ඇති අතර එයින් නව නිවාස 406 ක් 2017 වර්ෂයේ ස්වභාවික ආපදා හේතුවෙන් විපතට පත්වූවන් සඳහා අනුමත කර ඇත. නුවරඑළිය, හැටන්, කෑගල්ල, බදුල්ල, රත්නපුර, මහනුවර හා ගාල්ල යන වැවිලි ප්‍රදේශ 7 ආවරණය වන පරිදි ඉදි කෙරෙන මෙම නිවාසයන් ඒවායේ ඉදිකිරීම්වල විවිධ අදියරයන්හි පවතී. නිවසක වටිනාකම රු: 1,000,000/= ලෙසට ඇස්තමේන්තු ගත කර ඇති මෙම වැඩසටහන යටතේ නිවාස ඉදි කිරීම සඳහා වැය කෙරෙන මුදලෙන් 48% රජයේ ප්‍රදාන වශයෙන්ද, ඉතිරි 52% ණය මුදල් වශයෙන් ද ලබා දෙන අතර, නාය යාමෙන් නිවාස අහිමි වූවන් වෙත පූර්ණ ප්‍රදානයක් වශයෙන් නිවාස ලබා දීම සිදු කෙරේ.

### 2017 වර්ෂයේ ආරම්භ කරන ලද "හරිත රන් නිවාස" වැඩසටහනෙහි ප්‍රගතිය (2017 සැප්තැම්බර් 30 දිනට)

| අනු අංකය | බල ප්‍රදේශ | වතු සමාගම | වත්තේ නම | කොටස | ඒකක සංඛ්‍යාව | වෙන්කල ප්‍රතිපාදන (රු. මි.) | 2017.09.30 දිනට මූල්‍ය ප්‍රගතිය (රු. මි.) |
|---|---|---|---|---|---|---|---|
| 1 | ගාල්ල | කොටගල | හෝම්දොල | ස්ටොක්ලන්ඩ් | 15 | 15 | 0.38 |
| 2 | | මතුරට | හේයිස් | බී. කොටස | 22 | 22 | 12.55 |
| 3 | | | ෆොරෙස්ටර් | ගෝවින්න | 18 | 18 | 10.27 |
| 4 | | කොටගල | අරපොලකන්ද | ලිස්කිලන් | 29 | 29 | 0.73 |
| 5 | | කොටගල | ගීකියනකන්ද | වෙස්ට් | 12 | 12 | - |
| 6 | | කොටගල | වෝගන් | ඉද්දගොඩ | 22 | 22 | - |
| 7 | | කොටගල | ඩෙල්කිත් | ප්‍රින්සිලෝන් | 21 | 21 | - |
| 8 | | හොරණ | කොබෝවෙල | කොබෝවෙල | 21 | 21 | - |
| 9 | | හොරණ | නිව්චැටල් | හොම් | 31 | 31 | 0.78 |
| 10 | | හොරණ | නිව්චැටල් | ටෙම්පො | 25 | 25 | 0.63 |
| 11 | | හොරණ | මිල්ලකන්ද | සෙන්.ෆැරැන්සිස් | 6 | 6 | - |
| 12 | | හොරණ | මිල්ලකන්ද | ඇන්ඩ්‍රසන් | 5 | 5 | - |
| 13 | | හොරණ | මිල්ලකන්ද | මිහිරිගීකැලේ | 4 | 4 | - |
| 14 | | හොරණ | මිල්ලකන්ද | නිව් | 5 | 5 | - |
| 15 | | තලවකැලේ | ඉන්දොල | මාවරල | 10 | 10 | - |
| 16 | | නමුනුකුල | තැන්නහේන | දන්කොලුව | 5 | 5 | - |
| 17 | | නමුනුකුල | පැලවත්ත | පහළ හෙවැස්ස | 5 | 5 | - |
| | එකතුව | | | | 256 | 256 | 25.34 |

Contd...

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 1 | රත්නපුරය | බලන්ගොඩ | රාස්සගල | ඕවැල්ල | 12 | 12 | 0.30 |
| 2 | | හපුගස්තැන්න | මාදම්පෙ | නො.03 | 25 | 25 | 7.86 |
| 3 | | හපුගස්තැන්න | ස්ප්‍රින්වුඩ් | පාලම්කෝට්ටේ | 20 | 20 | 6.79 |
| 4 | | හපුගස්තැන්න | හපුගස්තැන්න | UWK | 31 | 31 | 6.45 |
| 5 | | බලන්ගොඩ | සෙසිල්ටන් | සෙසිල්ටන් | 12 | 12 | 4.02 |
| 6 | | කෑගල්ල | ඔඕගම | ඔඕගම (ගුරු නිවාස) | 2 | 2 | - |
| 7 | | පුස්සැල්ලාව | දිවුරුම්පිටිය | වලන්ගල | 32 | 32 | 8.74 |
| 8 | | කහවත්ත | පොරානුව | කිරිබත්ගල | 18 | 18 | - |
| 9 | | කහවත්ත | එක්රැල්ල | ඉලුක්කුඹුර | 12 | 12 | - |
| 10 | | අගලවත්ත | නූරාගල | පහළ | 1 | 1 | - |
| 11 | | අගලවත්ත | ක්ලූඩන් | පන්ටිය | 1 | 1 | - |
| 12 | | බලන්ගොඩ | මිල්ලවිටිය | පාරකෙටිය | 1 | 1 | - |
| 13 | | බලන්ගොඩ | මැදකන්ද | වෙලකුඹුර | 18 | 18 | - |
| 14 | | බලන්ගොඩ | මුතුවාගල | පහළ | 4 | 4 | - |
| 15 | | හපුගස්තැන්න | හපුගස්තැන්න (R) | ලෙල්ලොපිටිය | 54 | 54 | - |
| 16 | | හපුගස්තැන්න | හපුගස්තැන්න (T) | පහළ වේවැල්කෙටිය | 18 | 18 | - |
| එකතුව | | | | | 261 | 261 | 34.16 |
| 1 | බදුල්ල | හපුගස්තැන්න | පූනාගල | ෆැක්ට්‍රි/LLG | 59 | 59 | 5.47 |
| 2 | | බලන්ගොඩ | අම්පිටිකන්ද | පහළ/අධියර I | 52 | 52 | 17.64 |
| 3 | | බලන්ගොඩ | අම්පිටිකන්ද | පහළ/අධියර II | 45 | 45 | 15.27 |
| 4 | | බලන්ගොඩ | අම්පිටිකන්ද | පහළ/අධියර III | 30 | 30 | 10.18 |
| 5 | | බලන්ගොඩ | අම්පිටිකන්ද | පහළ/අධියර IV | 30 | 30 | 6.45 |
| 6 | | | | බ්ලැක්වුඩ් | 43 | 43 | 9.25 |
| 7 | | හපුගස්තැන්න | බිබිලෙ | 400 Arce | 13 | 13 | 0.33 |
| 8 | | බලන්ගොඩ | වේවැස්ස | දිබ්බැද්ද | 18 | 18 | 3.87 |
| එකතුව | | | | | 290 | 290 | 68.46 |
| 1 | කෑගල්ල | | යටිදෙරිය | නෝර්ත්බ්‍රෝක් | 20 | 20 | 2.40 |
| 2 | | ලලාන් | ඩෙන්ස්වෝත් | ඩෙන්ස්වෝත් | 23 | 23 | 12.46 |
| | | | | | 25 | 25 | - |
| 3 | | කැලනිවැලි | දේවාලකන්ද | දුනාදින් | 19 | 19 | 6.45 |
| 4 | | | එදුරපොල | වෙස්ට් | 10 | 10 | - |
| 5 | | ලලාන් රබර් | වුඩ්එන්ඩ් | තල්පිටිය | 8 | 8 | - |
| එකතුව | | | | | 105 | 105 | 21.31 |

*Contd...*

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 1 | | කහවත්ත | කැටබෝල | කඩියාලෙන | 20 | 20 | 0.50 |
| 2 | | පුස්සැල්ලාව | මූල්ඔය | මිඩ්ල් | 25 | 25 | 7.24 |
| 3 | | JEDB | හෝප් | ටොප් | 20 | 20 | 6.79 |
| 4 | | JEDB | මූල්ඔය | ඉහළ | 20 | 20 | 6.16 |
| 5 | | JEDB | කන්ඩල්ඔය | මේමලෙයි (ගුරු නිවාස 3 ක් ද ඇතුලත්ව) | 28 | 28 | 0.70 |
| 6 | | කහවත්ත | වෙස්ට්හෝල් | රිලාගල | 15 | 15 | 5.09 |
| 7 | | කහවත්ත | බාකපල් | ටොප් | 15 | 15 | 0.38 |
| 8 | | | කැටබූලා | හුනුකොටුව | 20 | 20 | 2.15 |
| 9 | මහනුවර | කහවත්ත | ගලබොඩ | පහළ | 20 | 20 | 4.30 |
| 10 | | කහවත්ත | ඉඹුල්පිටිය | ගල්ඔය | 20 | 20 | 4.30 |
| 11 | | පුස්සැල්ලාව | ලෙව්ලෝන් | කොල්ග්‍රේන් | 25 | 25 | 13.57 |
| 12 | | පුස්සැල්ලාව | ඩෙල්ටා | උතුර | 6 | 6 | 0.15 |
| 13 | | කහවත්ත | සෝගම | පහළ | 20 | 20 | 4.30 |
| 14 | | කහවත්ත | බාකපල් | පහළ | 15 | 15 | 0.38 |
| 15 | | එල්කඩුව | එල්කඩුව | දොතළාව | 20 | 20 | 11.41 |
| 16 | | SLSPC | හුන්නස්ගිරිය | UMO | 16 | 16 | 5.43 |
| 17 | | SLSPC | මෙල්ෆෝඩ් | නිව් මෙල්ෆෝඩ් | 10 | 10 | 2.15 |
| 18 | | | ඕපලගල | එලගොල්ල | 14 | 14 | 0.50 |
| එකතුව | | | | | 329 | 329 | 75.50 |
| 1 | | මදුල්සිම | වෙන්චර් | Upper Lowrence | 10 | 10 | 0.25 |
| 2 | | වටවල | ස්ට්‍රතන් | ෆුට්හිල් | 50 | 50 | 14.45 |
| 3 | | වටවල | ස්ට්‍රතන් | ස්ට්‍රතන් | 50 | 50 | - |
| 4 | | බොගවන්තලාව | ලෙතන්ටි | ලෙතන්ටි | 15 | 15 | 4.46 |
| 5 | | වටවල | ඇබෝට්ස්ලයි | ෆ්ලෝරන්ස් | 20 | 20 | 0.50 |
| 6 | | වටවල | දික්ඔය | පූල්බෑන්ක් | 20 | 20 | 4.30 |
| 7 | | වටවල | දික්ඔය | දික්ඔය | 20 | 20 | 0.50 |
| 8 | | බොගවන්තලාව | කැම්පියන් | U/D | 28 | 28 | 0.70 |
| 9 | | මඩුල්සිම | තෙරේසියා | කිලරි | 30 | 30 | 0.75 |
| 10 | | මඩුල්සිම | කකස්වල්ඩ් | මිඩ්ල් | 30 | 30 | 6.45 |
| 11 | හැටන් | මඩුල්සිම | කකස්වල්ඩ් | පහළ | 25 | 25 | 5.38 |
| 12 | | මස්කෙලිය | බ්‍රවුන්ලෝ | බ්‍රවුන්ලෝ | 20 | 20 | 5.54 |
| 13 | | මස්කෙලිය | මවුසාකැලේ | මවුසාකැලේ | 20 | 20 | 4.30 |
| 14 | | මස්කෙලිය | ස්ට්‍රත්ස්පි | ඕමිටබේල් | 25 | 25 | 14.26 |
| 15 | | බොගවන්තලාව | පොයිස්ටන් | නිව්ටෝන් | 20 | 20 | 0.50 |
| 16 | | කැලනිවැලි | ඉන්ජෙස්ට්‍රි | හොන්සි LD | 20 | 20 | 6.76 |
| 17 | | කොටගල | බොගවත්ත | පහළ | 60 | 60 | 16.13 |
| 18 | | කොටගල | මවුන්ටරන් | දිඹුල්ල | 25 | 25 | 7.24 |
| 19 | | කොටගල | මවුන්ටරන් | මිඩ්ල් | 55 | 55 | 21.42 |
| 20 | | කොටගල | ඩේ්ටන් | DT | 50 | 50 | 10.75 |
| 21 | | හොරණ | ටිල්කල්ට්‍රි | මවුසාඇල UD | 30 | 30 | 6.45 |

*Contd...*

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 22 | | මස්කෙලිය | ෆර්ලන් | තලන්කන්ද | 20 | 20 | 5.54 |
| 23 | | තලවකැලේ | තලවකැලේ | තලවකැලේ | 20 | 20 | 4.30 |
| 24 | | කොටගල | යුලිෆීල්ඩ් | YF | 27 | 27 | 0.68 |
| 25 | හැටන් | | ගෞරවිල | B | 17 | 17 | 0.38 |
| 26 | | | හැරින්ටන් | | 25 | 25 | - |
| 27 | | කොටගල | යුලිෆීල්ඩ් | යුලිෆීල්ඩ් | 1 | 1 | - |
| 28 | | මස්කෙලිය | බ්‍රවුන්ස්වික් | එමලිනා | 18 | 18 | - |
| 29 | | මස්කෙලිය | මවුසාකැලේ | Nyanza Upper | 20 | 20 | - |
| එකතුව | | | | | 771 | 771 | 141.99 |
| 1 | | තලවකැලේ | ලොජ් | ලොජ් | 15 | 15 | 5.09 |
| 2 | | තලවකැලේ | ග්‍රේට් වෙස්ටන් | Scalpa | 20 | 20 | 6.79 |
| 3 | | තලවකැලේ | ෆින්ලන්ඩ්ස් | කයිපුකැලේ | 20 | 20 | 6.79 |
| 4 | | කැලනිවැලි | පෙඩ්රෝ | ලොවර්ෂිප් | 30 | 30 | 10.01 |
| 5 | | පුස්සැල්ලාව | කොට්ලොජ් | පෝස්වුඩ් | 15 | 15 | 5.09 |
| 6 | | තලවකැලේ | රේඩැල්ල | ඉහළ | 24 | 24 | 6.77 |
| 7 | | | වෙවර්ලි | පෝට්මොර් | 24 | 24 | - |
| 8 | | වටවල | වෝල්ට්‍රිම් | මෙරායා | 20 | 20 | 4.30 |
| 9 | | වටවල | හෙන්ෆෝල්ඩ් | ග්ලෙන් ඊගල්ස් | 25 | 25 | 8.48 |
| 10 | නුවරඑළිය | වටවල | හෙන්ෆෝල්ඩ් | ආග්‍රා | 24 | 24 | 5.06 |
| 11 | | වටවල | හුට්විල් | බ්රේමොර් | 7 | 7 | 0.25 |
| 12 | | TRI | සෙන්.කෝම්ස් | පහළ | 25 | 25 | 7.74 |
| 13 | | ඇල්පිටිය | ෂීන් | ඉහළ පුන්ඩල්ඔය | 35 | 35 | 0.88 |
| 14 | | මතුරට | ලිඩිස්ඩේල් | AB | 35 | 35 | 14.25 |
| 15 | | මතුරට | කබරගල | ඉහළ | 14 | 14 | 4.74 |
| 16 | | | වොල්ට්‍රිම් | කොව්ලහේන | 48 | 48 | 10.32 |
| 17 | | | සෙන්.කෝම්ස් | ලෙමිලර් | 7 | 7 | 2.20 |
| 18 | | | ෆොරෝටොෆ්ට් | | 50 | 50 | - |
| 19 | | | කොන්කෝඩියා | ඩෙන්මාර්ක්හිල් | 16 | 16 | - |
| එකතුව | | | | | 454 | 454 | 98.76 |
| මුළු එකතුව | | | | | 2,466 | 2,466 | 465.52 |

## අවිච්ඡේද නිවාස

''නව ජීවන'' නිවාස වැඩසටහන යටතේ අවිච්ඡේදව පැවැති නිවාස 10 ක වැඩ කටයුතු මෙම වර්ෂයේදී අවසන් කර ඇත. 2016 වර්ෂයේ ආරම්භ කරන ලද ''හරිත රන්'' නිවාස ඒකක 1,430 අතුරින් නිවාස 493 ක වැඩ 2016 වර්ෂයේදීම නිමකර ජලය, විදුලිය, මාර්ග පහසුකම් ආදී යටිතල පහසුකම්ද සහිතව ප්‍රතිලාභී අයිතියට පත් කරන ලදී. එම ව්‍යාපෘතියේ 2017 දක්වා අවිච්ඡේදව පැවැති නිවාස 937 න් නිවාස 26 ක් 2017 වර්ෂයේ ''හරිත රන්'' නව නිවාස ව්‍යාපෘතියට ඇතුලත් කරන ලද අතර තවත් නිවාස 35 ක ඉදිකිරීම් කටයුතු පාරිසරික බලපෑම් හේතුවෙන් අත් හිටුවන ලදී. ඒ අනුව මෙම වර්ෂයේ තව දුරටත් ක්‍රියාත්මක කරන ලද නිවාස ඒකක 876 න් නිවාස 238 ක ඉදිකිරීම් 2017 සැප්තැම්බර් මස අවසන් වන විට නිම කර ඇත.

## හරිත රන් නිවාස වැඩසටහනේ අවිච්ඡේද ව්‍යාපෘතීන්හි ප්‍රගතිය (2017.09.30 දිනට)

| වැවිලි ප්‍රදේශ | වතු සමාගම | වත්තේ නම | කොටස | නිවාස සංඛ්‍යාව | මූල්‍ය ප්‍රගතිය (රු. මි.) | | භෞතික ප්‍රගතිය | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | | වෙන්කල ප්‍රතිපාදන | 2017.09.30 දිනට ප්‍රගතිය | නිමකල | ක්‍රියාත්මක වෙමින් පවතින |
| ගාල්ල | නමුනුකුල | හුලන්දාව | Main/බුලුවාන | 25 | 16.25 | 14.50 | 20 | 5 |
| | | | | 25 | 16.25 | 14.50 | 20 | 5 |
| රත්නපුරය | බලන්ගොඩ | බලන්ගොඩ | මාරතැන්න | 31 | 20.15 | 5.70 | | 31 |
| | බලන්ගොඩ | බලන්ගොඩ | දෙතනගල | 19 | 12.35 | 8.50 | | 19 |
| | කහවත්ත | හෝප් | යාඉන්න | 15 | 9.75 | 7.60 | | 15 |
| | බලන්ගොඩ | පෙට්ටිගල | ඉහළ | 48 | 31.20 | 14.90 | | 48 |
| | | | | 113 | 73.45 | 36.70 | | 113 |
| බදුල්ල | අගරපතාන | පිටරත්මලේ | ඉහළ | 47 | 30.55 | 10.20 | | 47 |
| | | | | 47 | 30.55 | 10.20 | | 47 |
| කෑගල්ල | කැලනිවැලි | පානවත්ත | Pan - 04 | 14 | 9.10 | 7.90 | | 14 |
| | කැලනිවැලි | කලුපහන | නිර්මල | 9 | 5.85 | 5.00 | 9 | |
| | කැලනිවැලි | කලුපහන | වහරක | 7 | 4.55 | 2.00 | | 7 |
| | කැලනිවැලි | කලුපහන | කලුපහන | 4 | 2.60 | 2.10 | | 4 |
| | කැලනිවැලි | කලුපහන | කලුපහන | 80 | 52.00 | 17.40 | 24 | 56 |
| | කෑගල්ල | අටාල | නිව්වරන්දර | 12 | 7.80 | 1.60 | | 12 |
| | | | | 126 | 81.90 | 36.00 | 33 | 93 |
| මහනුවර | පුස්සැල්ලාව | ගිරිගම | ගෝනාධික | 15 | 9.75 | 2.10 | | 15 |
| | කහවත්ත | ගලමුදුන | Winedor Forest | 11 | 7.15 | 2.20 | | 11 |
| | | කැලෑ බොක්ක | හුලන්කන්ද | 23 | 14.95 | 7.70 | | 23 |
| | කහවත්ත | බෝහිල් | බෝහිල් | 16 | 10.40 | 7.00 | | 16 |
| | කහවත්ත | ක්‍රේහෙඩ් | ඉහළ | 15 | 9.75 | 5.00 | | 15 |
| | | | | 80 | 52.00 | 24.00 | 0 | 80 |
| හැටන් | මස්කෙලිය | බ්‍රවුන්ස්වික් | බ්‍රවුන්ස්වික් | 25 | 16.25 | 14.60 | 25 | |
| | හොරන | මහනිලු | මහගල | 15 | 9.75 | 7.50 | | 15 |
| | කොටගල | ස්ටෝනික්ලිෆ් | රොසිටා | 23 | 14.95 | 13.40 | 23 | |
| | කැලනිවැලි | ඉන්ජෙස්ට්‍රි | පොට්රි | 7 | 9.75 | 5.10 | | 7 |
| | බොග වන්තලාව | කොටියාගල | පහළ | 184 | 117.55 | 85.59 | 43 | 141 |
| | | | | 254 | 168.25 | 126.19 | 91 | 163 |
| නුවර එළිය | ආගරපතන | හුට්විල් | ෆැන්කටන් | 150 | 95.49 | 54.81 | 71 | 79 |
| | ඇල්පිටිය | මැඩකොම්බ්‍රා | ඉහළ/පහළ | 23 | 14.95 | 13.00 | 23 | |
| | අගලවත්ත | වෙදමුල්ල | වෙවැන්ඩන් | 58 | 37.70 | 5.30 | | 58 |
| | | | | 231 | 148.14 | 73.11 | 94 | 137 |
| මුළු එකතුව | | | | 876 | 570.54 | 320.70 | 238 | 638 |

## 6.1.2. "ඉන්දියානු රජයේ සහාය යටතේ ඉදිවන" නිවාස ව්‍යාපෘතිය

ඉන්දියානු රජයේ සහාය යටතේ ආරම්භ කර ඇති මෙම ව්‍යාපෘතිය මගින් වැවිලි ප්‍රජාව වෙත නිවාස ඒකක 4,000 ක් ඉදිකිරීමට නියමිත ව ඇත. එක් නිවසක වටිනාකම රුː මිලියනයක් ලෙසට ඇස්තමේන්තු ගත කර ඇති අතර නිවසක් වෙනුවෙන් ඉන්දියානු රජය විසින් රුː 950,000/= ක්ද, අදාල වැවිලි සමාගම විසින් රුː30,000/= ක් හා ප්‍රතිලාභියා විසින් 20,000/= ක්ද දායකත්වයක් සපයනු ලබයි. මෙම නිවාස ව්‍යපෘතිය සඳහා අවශ්‍ය පානීය ජල පහසුකම්, විදුලිය, ප්‍රවේශ මාර්ග ඇතුළු අනෙකුත් යටිතල පහසුකම් ශ්‍රී ලංකා රජය මගින් සපයනු ලබයි. ඒ වෙනුවෙන් අමාත්‍යාංශ ප්‍රතිපාදන යටතේ 2017 වසර සඳහා රජයේ අරමුදල් මගින් රුːමි. 154 ක් ද ඉන්දියානු රජයේ ආධාර ලෙස රු.මි. 1,134 ක් ද වෙන්කර ඇත.

### 1 වන අදියර

මෙම ව්‍යාපෘතියේ ප්‍රථම අදියර වශයෙන් නිවාස ඒකක 1,134 ක් ඉදි කිරීමේ කටයුතු මේ වන විට ක්‍රියාත්මක වෙමින් පවතින අතර, 2017 සැප්තැම්බර් මස අවසන් වන විට නිවාස 75 ක ඉදි කිරීම් සම්පූර්ණයෙන් අවසන් කර ඇත. ඉතිරි නිවාස 1,059, විවිධ ඉදිකිරීම් අදියරයන්හි පවතී.

### 11 වන අදියර

මේ යටතේ, නාය යාමෙන් පීඩාවට පත් වූවන් හා නායයාමේ අවදානමට ලක් විය හැකි අධි අවදානම් ප්‍රදේශවල ජීවත් වන ජනතාව වෙනුවෙන් ප්‍රමුඛතාව දෙමින් නිවාස ඒකක 2,866 ක් ඉදිකිරීමට නියමිතව ඇත. අදාල වතු සමාගම්, ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය හා එක්ව ඉඩම් හඳුනා ගැනීම සිදුකර ඇත.







"ඉන්දියානු රජයේ සහාය යටතේ ඉදිවන" නිවාස ව්‍යාපෘතියේ පළමු අදියරේ ප්‍රගතිය (2017 සැප්තැම්බර් 30 දිනට)

| වැවිලි මානව සංවර්ධන භාර ප්‍රදේශය | වත්ත | කොටස | නිවාස සංඛ්‍යාව | මූලික කටයුතු | | ඉදි කිරීම් භෞතික ප්‍රගතිය | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | භූමිය සැකසීම අවසන් | ප්‍රතිලාභීන් තෝරීම අවසන් | ඉදිකිරීම ආරම්භ කළ සංඛ්‍යාව | අත්තිවාරම මට්ටම | බිත්ති මට්ටම | වහල මට්ටම | වැඩ අවසන් අදියර | නිම කරන ලද මුළු නිවාස සංඛ්‍යාව |
| හැටන් | බොග වාන | බ්‍රිඩ්වෙල් | 155 | 125 | 148 | 92 | 36 | 40 | 16 | | |
| | | ලින්ස්ටඩ් | 100 | ආරම්භ කර ඇත | 83 | - | - | | | | |
| | | බොගවාන | 100 | ආරම්භ කර නැත | 101 | - | - | | | | |
| | | **එකතුව** | **355** | **125** | **332** | **92** | **36** | **40** | **16** | | |
| බදුල්ල | ලෙජර් වත්ත | ලෙජර්වත්ත | 75 | 42 | 75 | 25 | 25 | | | | |
| | | නාරංගල | 50 | 20 | 50 | | - | | | | |
| | | **එකතුව** | **125** | **62** | **125** | **25** | **25** | | | | |
| නුවර එළිය | ඩන් සිනන් | Factory site | 200 | 146 | 158 | 146 | 40 | 21 | 33 | 19 | 33 |
| | | මැද කොටස | 204 | 65 | 91 | 38 | 33 | 5 | | | |
| | ඩයගම බටහිර | 1st Division | 150 | 150 | 134 | 95 | 4 | 31 | 5 | 13 | 42 |
| | | **එකතුව** | **554** | **361** | **383** | **279** | **77** | **57** | **38** | **32** | **75** |
| මහනු-වර | හෙල් බොඩ | හෙල්බොඩ | 100 | 94 | 100 | 88 | 59 | 29 | | | |
| | | **එකතුව** | **100** | **94** | **100** | **88** | **59** | **29** | | | |
| **එකතුව** | | | **1,134** | **642** | **940** | **484** | **197** | **126** | **54** | **32** | **75** |

## 6.1.3. ප්‍රතිලාභී මූලිකත්ව නිවාස වැඩසටහන

2005 වර්ෂයේ සිට මේ දක්වා වැවිලි ප්‍රදේශ ආශ්‍රිතව නිවාස ඒකක 30,000 ක් පමණ රජය ඇතුළු විවිධ ආයතන මූලිකත්වයෙන් ඉදිකර ඇති අතර, එම ඉදිකිරීම් වලින් වැඩි ප්‍රමාණයක් දැනට මෙම අමාත්‍යාංශය යටතේ පවතින ආයතනයක් වන වැවිලි මානව සංවර්ධන භාරයේ සම්බන්ධීකරණය යටතේ වතු සේවක නිවාස සමූපකාර සමිති (EWHCS) හරහා සිදු කර ඇත.

ඉහත ක්‍රමයන්ට පරිබාහිරව යමින් නවතම සංකල්පයකට යොමු වූ මෙම අමාත්‍යාංශය, 2017 වර්ෂයේ සිට "ප්‍රතිලාභී මූලිකත්ව" නිවාස සංකල්පය හඳුන්වා දී ඇත. ඒ අනුව එම ක්‍රමය යටතේ, රැකියාව කරනු ලබන වතුයායේම අදාල නිවාස ඉදිකරනු ලබන බැවින්, ප්‍රතිලාභීන්ට මෙම ඉදිකිරීම් සම්බන්ධව පූර්ණ වගකීම දරමින් තමාට අවශ්‍ය ආකාරයෙන් ශක්තිමත්ව හා මනා පිරිමැස්මකින් ඉදිකිරීම් සිදුකල හැකි අතර, නිවස ඉදිකිරීම වෙනුවෙන් ලබා දී ඇති මුදල ඉතිරි වේ නම් එම නිවසේ අමතර සංවර්ධන කටයුතු සඳහාද එය යෙදවිය හැකි වේ. මේ තුලින් වැවිලි ප්‍රජාවට තමන්ගේම තීරණ අනුව තම දායකත්වයෙන් ඉදිකරනු ලබන නිවසක අයිතිය හිමිවන බැවින් යැපුම් මානසිකත්වයෙන් තොර අභිමානී පුද්ගලයින් බවට ඔවුන් පත්වනු ඇත.

"හරිත රන් නිවාස" ක්‍රමයේදී මෙන්ම මෙහිදී ද, පර්චස් 07 ක භූමි ප්‍රමාණයක අයිතිය එක් පුද්ගලයෙකුට හිමිවන අතර, වර්ග අඩි 550 ක නිවසක අයිතිය ලැබේ. වැරන්ඩාවක්, ආලින්දයක්, නිදන කාමර


දෙකක්, මුළුතැන්ගෙයක් සහ යාබද වැසිකිලියකින් එක් නිවසක් සමන්විත වේ. මෙම නිවසක් ඉදිකිරීම සඳහා මූලික වියදම වශයෙන් රු. 50,000 හා ඉදිකිරීම් වියදම වශයෙන් (Preliminary) 950,000/- ක් ද ඇස්තුමේන්තු කර ඇත. ඒ අනුව එක් නිවසක වටිනාකම රු. 1,000,000 කි. එම මුදලින් 52% ක් ණය මුදලක් ලෙස වසර 15 කින් අය කර ගැනීමේ පදනම මත ලබාදෙන අතර, ඉතිරි 48% ප්‍රදානයක් ලෙස ලබා දේ.

### ව්‍යාපෘති ක්‍රියාත්මක කරනු ලබන ආකාරය:


- වතු අධිකාරිය වෙතින් ඉඩම් ලබා ගැනීමට අදාල කටයුතු වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය හරහා වැවිලි මානව සංවර්ධන භාරය මැදිහත්ව සිදුකරනු ලබන අතර, තෝරාගනු ලබන ප්‍රතිලාභීන්ට ඉඩම් කොටස් පවරා දෙනු ලැබේ.
- ප්‍රතිලාභීන් කිහිප දෙනෙකුගෙන් සමන්විත කණ්ඩායම් (5 - 8 කින්) සකසා, එම කණ්ඩායම් සඳහා නායකයින් තෝරාගනු ලබයි.
- නිවාස වැඩසටහන ක්‍රියාත්මක කිරීම නිවාස කමිටුවක් හරහා සිදු කරන අතර අදාල කණ්ඩායම් නායක, වතු සේවක සමූපකාර සමිතියෙහි (EWHCS) සභාපති, ලේකම් හා භාණ්ඩාගාරික හා වැවිලි මානව සංවර්ධන භාරයේ (PHDT) නිලධාරියෙකු ගෙන් එය සමන්විත වේ.
- නිවාස ඉදිකිරීමට අවශ්‍ය භාණ්ඩ අඩුම මිලට ලබා ගැනීමට කටයුතු කිරීම කමිටුව මගින් සිදුකරනු ලබන අතර නිවාස ප්‍රතිලාභින්ට ඉදිකිරීම් සම්බන්ධයෙන් තොරතුරු ලබා දීමට ඔවුන් බැඳී සිටී.

මෙම වැඩ සටහන තව දුරටත් පුළුල් කිරීම සඳහා අමාත්‍යාංශය විසින් විවිධ ආයතන වෙතින් අභිප්‍රාය ප්‍රකාශ (EOI) කැඳවීමද මේ වනවිට සිදුකර ඇත.

### අමාත්‍යාංශය මගින් ඉදිකරනු ලබන නිවසක සැළැස්ම




ඉදිරි පෙනුම




නිවාස සැලැස්ම





## 6.2. පසුගාමී ප්‍රදේශවල සමාජ ආර්ථික සංවර්ධනය

ඉතා අවම පහසුකම් යටතේ ජීවත් වන වතු ජනතාව සඳහා පානීය ජල ව්‍යාපෘති ඇති කිරීම, විදුලි පහසුකම් ලබා දීම, ප්‍රවේශ මාර්ග අලුත් වැඩියාව / ඉදිකිරීම, පඩිපෙළවල් ඉදි කිරීම, ලයින් කාමර වහල නැවත සෙවිලි කිරීම, ළමා සංවර්ධන මධ්‍යස්ථාන ඉදි කිරීම, ආගමික සහ සංස්කෘතික මධ්‍යස්ථාන ඉදි කිරීම යනාදී විවිධ වූ සංවර්ධන ව්‍යාපෘති මේ යටතේ ක්‍රියාත්මක කරනු ලබයි.

ඊට අමතර වශයෙන් හදිසි ආපදා තත්ත්වයනට පත්වූ වැවිලි ප්‍රජාව වෙනුවෙන් තාවකාලික වාසස්ථාන සකස් කිරීම හා ඊට අවශ්‍ය පහසුකම් සැලසීමද මේ යටතේ ක්‍රියාත්මක වේ.

පසුගාමී ප්‍රදේශවල සමාජ ආර්ථික සංවර්ධනය උදෙසා අමාත්‍යාංශය විසින් 2017 වසර සඳහා රුපියල් මිලියන 500 ක ප්‍රතිපාදන වෙන් කර ඇත. ඒ යටතේ, 2016 වසරේ අවසන් කාර්තුවේ අනුමත කරන ලද 2017 වසරට අඛණ්ඩ වූ ව්‍යාපෘති වෙනුවෙන් රු: මි. 10 ක් පමණ වෙන් කර ඇත.

### අඛණ්ඩ ව්‍යාපෘතිවල ප්‍රගතිය (2017.09.30 දිනට)

| අනු අංකය | ව්‍යාපෘතිය | ව්‍යාපෘති සංඛ්‍යාව | 2017 වර්ෂය සඳහා අනුමත මුදල (රු: මි.) | 2017.09.30 දිනට වියදම (රු: මි.) | 2017.09.30 දිනට නිමකල ව්‍යාපෘති සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| 1 | ක්‍රීඩා පිටි | 2 | 1.42 | 0.89 | 2 |
| 2 | ළමා සංවර්ධන මධ්‍යස්ථාන සංවර්ධනය | 2 | 2.56 | 1.00 | 1 |
| 3 | ආගමික සිද්ධස්ථාන හා සංස්කෘතික මධ්‍යස්ථාන සංවර්ධනය | 3 | 2.18 | 1.27 | 3 |
| 4 | ජල ව්‍යාපෘති | 3 | 2.10 | 1.66 | 3 |
| 5 | පාසල් සංවර්ධය | 1 | 0.13 | - | 1 |
| 6 | වෙනත් (ආරක්ෂිත බැමියනාදිය) | 2 | 0.68 | 0.49 | 2 |
| 7 | විදුලි ඉදි කිරීම (විදුලි 10) | 1 | 0.23 | 0.22 | 1 |
| 8 | මාර්ග සංවර්ධන ව්‍යාපෘති | 1 | 0.38 | 0.29 | 1 |
| එකතුව | | 15 | 9.68 | 5.82 | 14 |

## 2017 වසරේ ආරම්භ කරන ලද නව වැඩසටහන් හා එහි ප්‍රගතිය.

### 6.2.1. වහල දිරාපත්වීම හේතුවෙන් වාසස්ථානයකට නුසුදුසු තත්ත්වයේ ඇති පේලි නිවාස 1640 ක වහල නැවත සෙවිලි කිරීම.

පේලි නිවාස වල ජීවත් වන සමස්ථ වැවිලි ප්‍රජාව වෙනුවෙන් නව නිවාස ඉදිකිරීම දීර්ඝ කාලීන ව්‍යාපෘතියක් වන බැවින්, එතෙක් එම ප්‍රජාවගේ වාසස්ථානයන්හි තත්ත්වය ඉහළ නැංවීමේ අතුරු පියවරක් වශයෙන් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලබයි.

ඒ අනුව, 2016.12.31 දින වනවිට රු. මි. 135 ක පිරිවැයක් දරමින් නිවාස ඒකක 1,605 ක වහලයන් නැවත සෙවිලි කර ඇති අතර එයට අමතරව තවත් නිවාස ඒකක 1,200 ක වහල නැවත සෙවිලි කිරීම සඳහා 2017 වර්ෂයේදී රු. මි. 60 ක් මෙම අමාත්‍යාංශය මගින් වෙන්කර ඇත. සැප්තැම්බර් මස අවසන් වන විට රු. මි. 26 ක මුදලක් වැවිලි මානව සංවර්ධන භාරයේ නුවරඑළිය, හැටන්, කෑගල්ල, බදුල්ල,

රත්නපුර, මහනුවර යන වැවිලි ප්‍රදේශ වෙත ලබා දී ඇති අතර, පේළි නිවාස 452ක වහළ ඒ යටතේ සෙවිලි කර ඇත.

### 6.2.2. සෞඛ්‍යාරක්ෂිත පානීය ජල පහසුකම් සැපයීම.

ජල උල්පත් බොහොමයක් වතු ජනාවාස ස්ථාන ගත වී ඇති කඳුකර ප්‍රදේශයෙන් ආරම්භ වුවද සෞඛ්‍යාරක්ෂිත පානීය ජලය ලබා ගැනීමේ හැකියාව වතු ජනතාව වෙත හිමි වී ඇත්තේ ඉතා අල්ප වශයෙනි. ජල සැපයුම් අනාරක්ෂිතව තිබීම හේතුවෙන් ජලය මගින් පැතිරී යන පාචනය වැනි රෝග බොහොමයකට ගොදුරු වීමේ වැඩි අවදානමක් වැවිලි ප්‍රජාවතුල පවතින බැවින්, එසේ හඳුනාගත් ප්‍රදේශ ඉලක්ක කර ගනිමින් ජල සම්පාදන ව්‍යාපෘති ආරම්භ කර ඇත.

මෙම අමාත්‍යාංශය මගින් ක්‍රියාවට නංවනු ලබන 2016 - 2020 ක්‍රියාකාරී සැලැස්මට අනුව 2020 වර්ෂය අවසන් වන විට ජල සම්පාදන යෝජනා ක්‍රම 500ක් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත අතර එහිදී පහත සඳහන් ක්‍රියාකාරකම් කෙරෙහි ද අවධානය යොමු කර ඇත.

- නව ජල ධාරාවන් සහ ජල උල්පත් හඳුනා ගැනීම
- ජල ධාරාවන් සහ ජල උල්පත් ආරක්ෂා කිරීම සඳහා ඒ අවට පිහිටි රක්ෂිත ප්‍රදේශයන්ට අයත් සීමාවන් ලකුණු කිරීම
- විවෘත ප්‍රදේශයන් හි මළපහ කිරීම වැළැක්වීමට වතුවල විවේකාගාර ඉදි කිරීම.
- ජල සම්පාදන හා ජල පෙරන ක්‍රමයන් හඳුන්වා දීම
- ජල මූලාශ්‍ර සංරක්ෂණය
- ප්‍රතිලාභ දායකත්ව යෝජනා ක්‍රමය ශක්තිමත් කිරීම. මෙය දැනටමත් ක්‍රියාත්මක වේ.

2016 වර්ෂයේදී ආරම්භ කර, සම්පූර්ණ කිරීමට නොහැකි වූ ජල ව්‍යාපෘති 04 න් 02 ක වැඩ 2017 සැප්තැම්බර් මස අවසන් වන විට නිමාකර ඇති අතර 2017 වර්ෂය තුලදී ජල සම්පාදන ව්‍යාපෘති 80 ක් ක්‍රියාත්මක කිරීම සඳහා රු. මි. 36 ක් වෙන්කර ඇත. 2017.09.30 දින වනවිට නව ජල සම්පාදන ව්‍යාපෘති 62 ක් ආරම්භ කර ඇති අතර ඉන් එක් ව්‍යාපෘතියක් අවසන් කර ඇත. ඉන් ව්‍යාපෘති 54 ක් වැවිලි මානව සංවර්ධන භාරය විසින් ක්‍රියාත්මක කරනු ලබන අතර තවත් ව්‍යාපෘති 08ක් දිස්ත්‍රික් ලේකම් කාර්යාල හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල මගින් ක්‍රියාත්මක කරනු ලබයි. 2017.09.30 දිනට මූල්‍ය ප්‍රගතිය රු.මි. 17 ක් වන අතර අමාත්‍යාංශය විසින් 2016.12.31 දක්වා ජල සම්පාදන ව්‍යාපෘති වෙනුවෙන් වැයකර ඇති සමස්ථ පිරිවැය රු.මි. 77 කි.

### 2017 වර්ෂයේ ක්‍රියාත්මක කරනු ලබන ජල සම්පාදන ව්‍යාපෘතීන් (2017.09.30 දිනට)

| ක්‍රියාත්මක කරනු ලබන ආයතන | ජල ව්‍යාපෘති සංඛ්‍යාව | නුවරඑළිය | හැටන් | රත්නපුර | ගාල්ල | කෑගල්ල | බදුල්ල | මහනුවර |
|---|---|---|---|---|---|---|---|---|
| වැවිලි මානව සංවර්ධන භාරය | 54 | 8 | 5 | 24 | 5 | 5 | 3 | 4 |
| දිස්ත්‍රික් ලේකම් කාර්යාල / ප්‍රාදේශීය ලේකම් කාර්යාල | 08 | 5 | - | 2 | - | - | 1 | - |
| එකතුව | 62 | 13 | 5 | 26 | 5 | 5 | 4 | 4 |

### 6.2.3. සනීපාරක්ෂක පහසුකම් සැපයීම

දත්ත සමීක්ෂණ වාර්තා අනුව වැවිලි ප්‍රජාවගෙන් 25 % කට අධික ප්‍රමාණයක් සඳහා දියුණු සනීපාරක්ෂක පහසුකම් ලැබී නොමැති බව පෙනී යයි. ලයින් කාමරවල ජීවත් වන එම ජනතාව වෙනුවෙන් ප්‍රමාණවත්

සනීපාරක්ෂක පහසුකම් සැපයීමේ අරමුණින් 2016 - 2020 යන වසර පහ තුලදී නව වැසිකිළි 20,000 ක් නිම කිරීමට අපේක්ෂිත අතර 2017 වර්ෂය ආරම්භ වනවිට රු. මි. 60 ක් වැයකොට වැසිකිළි 1,232 ක් ඉදිකර ප්‍රතිලාභීන් වෙත පවරා ඇත. එමෙන්ම 2017 වර්ෂය සඳහා වැසිකිළි 650ක් ඉදි කිරීම වෙනුවෙන් මෙම අමාත්‍යාංශය විසින් රු.මි. 37ක මුදලක් වෙන්කර ඇති අතර 2017.09.30 දින වනවිට වැසිකිළි 589 ක් ඉදිකිරීම සඳහා අනුමැතිය ලබා දී ඇත. ඉන් වැසිකිළි 489 ක් වැවිලි මානව සංවර්ධන භාරය විසින් ක්‍රියාත්මක කරනු ලබන අතර, කෑගල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වැසිකිළි 100ක ඉදිකිරීමේ කටයුතු අරඹා ඇත. 2017 සැප්තැම්බර් 30 දිනට සමස්ථ මූල්‍ය ප්‍රගතිය රු: මි. 17 කි.

**2017 වර්ෂයේ ක්‍රියාත්මක කරනු ලබන වැසිකිළි ඉදි කිරීමේ ව්‍යාපෘතීන් (2017.09.30 දිනට)**

| ක්‍රියාත්මක කරනු ලබන අයතනය | වැසිකිළි සංඛ්‍යාව | නුවරඑළිය | හැටන් | රත්නපුර | ගාල්ල | කෑගල්ල | බදුල්ල | මහනුවර |
|---|---|---|---|---|---|---|---|---|
| වැවිලි මානව සංවර්ධන භාරය | 489 | 60 | 137 | 20 | 102 | 52 | 60 | 58 |
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | 100 | - | - | - | - | 100 | - | - |
| එකතුව | 589 | 60 | 137 | 20 | 102 | 152 | 60 | 58 |

### 6.2.4. ළමා සංවර්ධන මධ්‍යස්ථාන ඉදි කිරීම / නවීකරණය කිරීම

ශ්‍රී ලංකාව තුල වැවිලි ක්ෂේත්‍රය ආරම්භ වූ මුල් යුගයේ පටන් රැකියාවන් හි නිරත ප්‍රජාවගේ අවු 02 - 05 දක්වා ළමුන්ගේ රැකවරණය ළමා සංවර්ධන මධ්‍යස්ථාන හරහා ක්‍රියාත්මක විය. වයස අවුරුදු 2 ට අඩු දරුවන් රැක බලා ගැනීම හා අවුරුදු 3-5 අතර ළමයින්ගේ සමාජ ක්‍රියාකාරකම් වර්ධනය, ස්ව භාෂාව දියුණු කිරීම, සෞන්දර්ය කුසලතාවයන් හා බුද්ධිමය හැකියාවන් වර්ධනය, දරුවන් පාසල් අධ්‍යාපනයට හුරු කිරීම, යනාදී කාර්යයන් ළමා සංවර්ධන මධ්‍යස්ථාන හරහා සිදු කරනු ලබයි.

වැවිලි ක්ෂේත්‍රයේ ළමුන්ගේ මුල් ළමාවිය රැකවරණ කටයුතු සම්බන්ධ මැදිහත්වීම සිදුකරනු ලබන්නේ වැවිලි මානව සංවර්ධන භාරය විසිනි. ඒ අනුව වතු කළමණාකාරීත්වය යටතේ මේ වනවිට ළමා සංවර්ධන මධ්‍යස්ථාන 1,544 කට වැඩි සංඛ්‍යාවක් පවත්වාගෙන යනු ලැබේ.

ඉඩ පහසුකම් නොමැතිවීම, උපකරණ හිඟවීම, නිසි නඩත්තුවක් නොවීම, රැකවරණය සපයන්නන්ගේ හා ගුරුවරුන්ගේ ගුණාත්මකභාවය යනාදී කරුණු පදනම් කරගනිමින් කරන ලද ප්‍රමිති වර්ගීකරණය අනුව මධ්‍යස්ථාන අතුරින් 62% ක් "ඒ" සහ "බී" ශ්‍රේණි ලෙසද අවම පහසුකම් ඇති 38% ක් "සී" සහ "ඩී" ශ්‍රේණි ලෙසද හඳුනාගෙන ඇත. එසේ "සී" සහ "ඩී" ශ්‍රේණි ලෙස හඳුනාගත් ළමා සංවර්ධන මධ්‍යස්ථාන සංඛ්‍යාව 550 ට අධික වන අතර මෙම මධ්‍යස්ථාන කඩිනමින් සංවර්ධනය කල යුතුව ඇත.

ලෝක බැංකු ව්‍යාපෘතිය මගින් 2015 - 2020 කාල පරිච්ඡේදය තුල තෝරාගත් ළමා සංවර්ධන මධ්‍යස්ථාන සංවර්ධනයද ඇතුළුව මුල් ළමාවිය සංවර්ධනය හා රැකවරණය වෙනුවෙන් ඇමරිකානු ඩොලර් දස ලක්ෂ 10 ක මුදලක් වෙන්කර ඇත.

රජයේ අරමුදල් යොදවමින් මෙම අමාත්‍යාංශය විසින් ළමා සංවර්ධන මධස්ථාන 100ක්, වර්ෂ 2020 වන විට වැවිලි ක්ෂේත්‍රය තුල සංවර්ධනය කිරීමට අපේක්ෂිතය. 2017 වර්ෂය ආරම්භවන විට රු.මි. 16 ක පිරිවැයක් දරමින් මධ්‍යස්ථාන 21 ක් සංවර්ධනය කර ඇති අතර, මෙම වර්ෂයේදී ද ඒ සඳහා රු.මි. 16 ක් වෙන්කර, වැවිලි මානව සංවර්ධන භාරය හරහා ක්‍රියාත්මක කරනු ලැබේ. ඒ අනුව ළමා සංවර්ධන මධ්‍යස්ථාන අළුත්වැඩියාව අරඹා ඇති අතර, එක් මධ්‍යස්ථානයක අළුත්වැඩියාවන් අවසන් කර ඇත.

### 2017 වර්ෂය සඳහා ළමා සංවර්ධන මධ්‍යස්ථාන ඉදි කිරීම/ සංවර්ධනය කිරීම (2017.09.30 දිනට)

| ක්‍රියාත්මක කරනු ලබන ආයතන | ළමා සංවර්ධන මධ්‍යස්ථාන සංඛ්‍යාව | ප්‍රාදේශීය මට්ටමින් | | | | |
|---|---|---|---|---|---|---|
| | | කෑගල්ල | හැටන් | රත්නපුර | ගාල්ල | මහනුවර |
| වැවිලි මානව සංවර්ධන භාරය | 19 | 9 | 2 | 3 | 4 | 1 |

### 6.2.5. ප්‍රවේශ මාර්ග සංවර්ධනය

ප්‍රවාහන පහසුකම් ඇති කිරීම සඳහා වතු මාර්ග ජාලය මනාලෙස ප්‍රතිසංස්කරණය, සංවර්ධනය සහ නඩත්තුව සිදුකල යුතුව ඇත. ශ්‍රමිකයන්ගේ දෛනික ගමනාගමනයට, නිෂ්පාදන හා වෙළඳ භාණ්ඩ ගුණාත්මක ලෙස ප්‍රවාහනයට මෙන්ම රෝගී අවස්ථාවන්හිදී හදිසි ප්‍රතිකාර සඳහා යොමු කිරීම යනාදී කරුණු සැලකිල්ලට ගත් කළ ඉතා අබලන් තත්ත්වයේ පවතින වතු ප්‍රවේශ මාර්ග ජාලය සංවර්ධනය / ප්‍රතිසංස්කරණය කිරීම අත්‍යාවශ්‍ය කටයුත්තක්ව පවතී.

ඒ අනුව මෙම අමාත්‍යාංශ ප්‍රතිපාදන යටතේ වැවිලි ප්‍රජාව ඉලක්ක කර ගනිමින් ප්‍රවේශ මාර්ග ලබා දීම, පඩිපෙළවල් හා කානු පද්ධති සංවර්ධනය කිරීම, ආරක්ෂිත බැම් සැකසීම සිදු කරනු ලබන අතර, විශේෂයෙන් රජයේ රෝහල් වෙත නිසි ප්‍රවේශ මාර්ග නොමැති වතු කෙරෙහි වැඩි අවධානය යොමු කරමින් එකී මාර්ග සංවර්ධනය සඳහා 2017 වර්ෂය තුළදී රු.මි. 125 ක් (කිලෝ මීටර් 25 ක් සඳහා) වෙන්කර ඇති අතර වැවිලි මානව සංවර්ධන භාරය හරහා එම ව්‍යාපෘති ක්‍රියාත්මක කෙරේ.

### 6.2.6. පොදු පහසුකම් සංවර්ධනය

ක්‍රීඩා පහසුකම් සැපයීම හා වැවිලි ප්‍රජාවගේ පොදු ජන ජීවිතය යථාවත් වනු පිණිස අවැසි වෙනත් පහසුකම් විශේෂයෙන් ආගමික හා සංස්කෘතික මධ්‍යස්ථාන නගා සිටුවීම, සුභසාධන සංගම් වෙත අවශ්‍ය උපකරණ ලබා දීම මේ යටතේ සිදු කරනු ලබයි. 2015 සහ 2016 වර්ෂයන් තුළදී මෙම අමාත්‍යාංශය විසින් පොදු පහසුකම් සංවර්ධනය සඳහා රු. මි. 255 ක් වැය කර ඇති අතර මෙම වර්ෂය තුළදී වෙන්කර ඇති මුදල රු.මි. 226කි. 2017 වර්ෂය සඳහා ව්‍යාපෘති 500 ක් සඳහා අනුමත කර ඇති අතර එහි මූල්‍ය ප්‍රගතිය රු.මි. 29 කි .

### පසුගාමී ප්‍රදේශ සංවර්ධනය සඳහා 2017 වසරේ ක්‍රියාත්මක කරන ලද නව ව්‍යාපෘතින්

| ව්‍යාපෘතියේ ස්වභාවය | ක්‍රියාත්මක කරනු ලබන අයාතනය | | 2017 වර්ෂයේදී ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ඒකක සංඛ්‍යාව | වෙන්කල රු: මි. | 2017.09.30 ක්‍රියාත්මක කල ඒකක සංඛ්‍යාව | 2017.09.30 දිනට වියදම රු: මි. | මූල්‍ය ප්‍රගතිය % |
|---|---|---|---|---|---|---|---|
| | වැ. මා. ස. භා. | ප්‍රා. ලේ. | | | | | |
| වහල නැවත සෙවිලි කිරීම | ✓ | ✓ | 1640 | 60.00 | 452 | 25.4 | 42.3 |
| ජල සම්පාදනය | ✓ | ✓ | 80 | 36.40 | 62 | 4.02 | 11.04 |
| වැසිකිළි ඉදිකිරීම | ✓ | ✓ | 650 | 37.00 | 589 | 16.62 | 44.9 |
| ළමා සංවර්ධන මධ්‍යස්ථාන නවීකරණය | ✓ | | 23 | 16 | 19 | 1.56 | 9.75 |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| රේහල් මාර්ග සංවර්ධන ව්‍යාපෘති | ✓ | | 15 | 125 | 9 | | |
| ක්‍රීඩා පිටි / ප්‍රවේශ මාර්ග ආගමික / සංස්කෘතික මධ්‍යස්ථාන සංවර්ධනය වෙනත් පොදු පහසුකම් | ✓ | ✓ | 500 | 225.60 | 405 | 58.90 | 26.1 |
| | | | | 500.00 | | 106.5 | 21.3 |

## 6.3. ජීවනෝපාය සංවර්ධනය.

වර්තමාන තාක්ෂණික ප්‍රවනතාවයත් සමඟ වැවිලි අංශය කිහිප ආකාරයකින් අභියෝගයට ලක්වී ඇත. එයට ප්‍රධාන වශයෙන් හේතු වන්නේ වත්මන් පරපුර වැවිලි අංශයේ දැනට පවතින සාම්ප්‍රදායික ක්‍රමවේදයනට අනුගත වීමේදී දක්වන පසුගාමීත්වය, ශ්‍රමයට වැඩි වැටුපක් හා සමාජයේ පිළිගැනීමක් අපේක්ෂා කිරීමයි. මෙහි අවසන් නිෂ්ඵල වී ඇත්තේ නිසි නිපුණතාවයක් හෝ පුහුණුවක් නොමැතිව තරුණ වැවිලි ප්‍රජාව ක්ෂේත්‍රයෙන් බැහැරව වෙනත් ඉලක්ක සොයා නොපැහැදිලි අනාගතයකට පියමන් කිරීමයි.

එකී තත්ත්වය මග හරිමින් වැවිලි ක්ෂේත්‍රයට පරිබාහිරව සුදුසු රැකියා ලබා ගැනීමේ අවස්ථා වැඩි කිරීමටත්, ශ්‍රමිකයින් වැවිලි ක්ෂේත්‍රයට ආකර්ෂණය කිරීමටත්, ඒ තුල රඳවා ගැනීම සඳහා සුදුසු වැඩ පරිසරයක් ඇති කිරීමටත්, වැවිලි ක්ෂේත්‍රය තුල හිඳිමින් අතිරේක ආදායමක් ඉපයීමට ඇති අවස්ථාවන් වැඩි කිරීමටත්, ජාතික ක්‍රියාකාරී සැළැස්ම මගින් අවධානය යොමු කර ඇති අතර ඒ අනුව, නිපුණතා සංවර්ධනය හා වෘත්තීය පුහුණුව, ප්‍රජා සවිබල ගැන්වීම (කාන්තාවන් හා තරුණ තරුණියන්) සඳහා අවශ්‍ය දැනුම, තාක්ෂණික ඥානය හා පුහුණුව ලබාදීම, උපකරණ හා පහසුකම් ලබාදීම, දිළිඳුකම තුරන් කිරීමේ වැඩසටහන් ඇතුළු සමාජ සවිබල ගැන්වීම් වැඩසටහන් රාශියක් මෙම අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක කරනු ලබයි.



### 6.3.1. ප්‍රජාව දැනුවත් කිරීම

අතිගරු ජනාධිපතිතුමාගේ විශේෂ අවධානයට පාත්‍රවූද, ජාතික අවශ්‍යතාවක් සේ සලකා ක්‍රියා කරන්නාවූ ද, සෞඛ්‍යය හා පෝෂණ තත්ත්වය ඉහල නැංවීම, වකුගඩු රෝග මැඩලීම, මත්ද්‍රව්‍ය නිවාරණය, පරිසර සංරක්ෂණය, ජල මූලාශ්‍ර සංරක්ෂණය වැනි වැඩසටහන් ක්‍රියාත්මක කොට වැවිලි ප්‍රජාව දැනුවත් කිරීම සඳහා 2015 - 2016 වර්ෂයන් තුලදී රු.මි. 5 ක් පමණ වැයකර ඇති අතර, 2020 වර්ෂය වනවිට දැනුවත් කිරීමේ වැඩ සටහන් 1000 ක් පමණ දියත් කරමින්, ජනතාවගේ ජීවන මට්ටම හා පෝෂණ තත්ත්වය මෙන්ම, ආකල්ප සංවර්ධනය තුලින් ද ඔවුන් නව මාවතකට යොමු කිරීමට අපේක්ෂා කර ඇත. මීට අමතරව, වැවිලි මානව සංවර්ධන භාරයේ ප්‍රාදේශීය කාර්යාල හරහා පරිසර හා ජල සංරක්ෂණ වැඩසටහන්ද ක්‍රියාත්මක කෙරේ. මෙම ව්‍යාපෘති සඳහා 2017 වර්ෂයේදී රු. මි. 10ක් වෙන්කර ඇත. සැප්තැම්බර් අවසන් වනවිට රු: මි. 5 ක් පමන යොදවා 78% ක පමණ ප්‍රගතියක් අත්පත් කරගනිමින් වැඩසටහන් 155ක් පවත්වා ඇත.

### 6.3.2. දිළිඳුකම පිටු දැකීමේ වැඩසටහන

සවිමත් ආර්ථික ශක්තියකින් හෙබි අඳීන ජාතියක් ගොඩ නංවා "පතිරූප දේශයක් බිහි කිරීම" හා එක්සත් ජාතීන්ගේ තිරසර සංවර්ධන වැඩසටහනට සමගාමීව එහි ප්‍රථම අපේක්ෂාව වූ දිළිඳුකම ජනතාව තුලින් තුරන් කිරීම උදෙසා අතිගරු ජනාධිපතිතුමාගේ සංකල්පයක් මත වර්ෂ 2030 වනවිට දිළිඳුකමින් තොර ශ්‍රී ලංකාවක් බිහි කිරීමේ අරමුණ ඇතිව, 2017 වර්ෂය "දිළිඳුකම පිටු දැකීමේ වර්ෂය" ලෙස ප්‍රකාශයට පත්කර ඇත. ඉහළම දරිද්‍රතා අගයන් පිළිබිඹු කරනු ලබන වැවිලි ප්‍රජාව ඉලක්ක කොට ස්වයං රැකියා වැඩිදියුණුව, ආහාර සුරක්ෂිතතාව හා පෝෂණය, කුඩා පරිමාණ ගෙවතු වගාව, නිවාස

හා ළමා සංවර්ධන මධ්‍යස්ථානයන්හි ගෙවතු වගාව, මිරිදිය මත්ස්‍ය වගාව හා මුඩු ඉඩම් වගාව යනාදී තේමාවන් යටතේ විවිධ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍යාංශය විසින් රු.මි. 30 ක් වෙන්කර ඇති අතර 2017 09.30 දින වනවිට ක්‍රියාකාරකම් 1050 ක් ක්‍රියාවට නංවා ඇත.

මෙම වැඩසටහන වඩාත් ප්‍රායෝගිකව ඉටු කරනු පිණිස ''ස්වයං රැකියා චක්‍රීය අරමුදල'' යටතේ ණය පහසුකම් ලබාදීම සඳහා ලංකා බැංකුව සමඟ ගිවිසුමකටද එළඹෙන ලදී.

### 6.3.3. නිපුණතා සංවර්ධනය, යෞවනයින් බල ගැන්වීම

අ.පො.ස (සා/පෙළ) හා අ.පො.ස. (උ/පෙළ) න් පසුව අධ්‍යාපනය හැරයන්නන් නිසි ජීවනෝපාය ක්‍රමවේදයකට අනුගත කරවීම සඳහා අවශ්‍ය මාර්ගෝපදේශකත්වය හා වෘත්තීය පුහුණුව ලබාදීම මෙම ව්‍යාපෘතියේ මූලික අරමුණ වේ. ඒ අනුව මෙම අමාත්‍යාංශය යටතේ පවතින ප්‍රජා ශක්ති ව්‍යාපෘතිය හරහා දහසකට අධික වැවිලි ක්ෂේත්‍රයේ තරුණ ප්‍රජාව ඉලක්ක කොට වැඩසටහන් 30 ක් පමණ ක්‍රියාත්මක කර ඇති අතර 2017 වර්ෂයේදී මේ සඳහා රු.මි. 10 ක් වෙන්කර ඇත.

### 6.3.4. ප්‍රජා සංවර්ධනය සඳහා පහසුකම් සැපයීම

නායකත්වය පුහුණුව හා සංවර්ධන කාර්යයන් කෙරෙහි ප්‍රජා දායකත්වය ඉහළ නැංවීම උදෙසා ප්‍රජාව තුල උද්යෝගයක් ඇති කිරීම කෙරෙහි අමාත්‍යාංශය විසින් අවධානය යොමු කර ඇති අතර, ඒ සඳහා ප්‍රජා සංවර්ධන මධ්‍යස්ථාන වැඩි දියුණු කිරීම හා නව ප්‍රජා සංවර්ධන මධ්‍යස්ථාන ඇති කිරීමට පියවර ගෙන ඇත. මේ යටතේ හැටන්, නෝර්වුඩ්හි පිහිටා ඇති ක්‍රීඩා සංකීර්ණය සංවර්ධනයට ද අවශ්‍ය පියවර ගෙන ඇති අතර හැටන් ප්‍රදේශයේ පාසල් දරුවන්ගේ හා තරුණ ප්‍රජාවගේ ක්‍රීඩා කෞශල්‍යයන් ඉහළ නැංවීම මෙමගින් අපේක්ෂා කරනු ලබයි. මේ සඳහා මෙම වර්ෂයේදී රු. මි. 10 කට ආසන්න මුදලක් වෙන්කර ඇති අතර රු.මි. 5 ක මූල්‍ය ප්‍රගතියක් 2017.09.30 දින වන විට අත්කරගෙන ඇත.







# 07

# අමාත්‍යාංශය විසින් 2017 වසරේ අත්පත් කර ගන්නා ලද විශේෂ ජයග්‍රහණ

## 7.1. වැවිලි ප්‍රජාව සඳහා ඉඩම් අයිතිය තහවුරු කර දීම.

ප්‍රථම වතාවට වැවිලි ප්‍රජාව වෙත නිරවුල් ඉඩමක අයිතිය හිමිකර දීම අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් 2017.02.09 දින හැටන් හුට්විල් වතුයායේ දී සිදු කළ අතර එහිදී නිවාස ප්‍රතිලාභීන් 71 දෙනෙකු සඳහා නිරවුල් ඔප්පු ප්‍රදානය කරන ලදී.

## 7.2. නව නිවාස 10,000 ක් ඉදි කිරීම සඳහා ඉන්දියානු රජයේ එකඟත්වය ලැබීම

ඉන්දීය අග්‍රාමාත්‍ය ගරු නරේන්ද්‍ර මෝදි මැතිතුමාගේ ශ්‍රී ලංකා සංචාරය තුලදි ඉන්දීය දෙමළ සම්භවයක් ඇති වැවිලි ප්‍රජාව ඇමතීම සඳහා අවස්ථාවක් උදා කර දෙමින් රැස්වීමක් සංවිධානය කිරීම හා ඉන්දීය රජයේ පූර්ණ ආධාර යටතේ නව නිවාස ඒකක 10,000 ක් වැවිලි ප්‍රජාව වෙත හිමි කරදීම සඳහා ඉන්දීය රජයේ අනුග්‍රහය ලබා ගැනීම.



## 7.3. ප්‍රතිලාභී මූලිකත්ව නිවාස ක්‍රමය හඳුන්වා දීම.

කොන්ත්‍රාත් ක්‍රමය මත පදනම්ව නිවාස ඉදිකිරීමේ දී ඇතිවන ගැටළු මගහරවා ගැනීම පිණිස මේ දක්වා ක්‍රියාත්මක කරන ලද කොන්ත්‍රාත්කරුවන් පදනම් කරගත් නිවාස ඉදි කිරීමේ ක්‍රමය වෙනුවට ඉදිකිරීම් සඳහා වන ප්‍රතිපාදන ප්‍රතිලාභීන් වෙත යොමුකර, ඔවුන්ගේම ශ්‍රම දායකත්වයෙන් නිවාස ඉදි කිරීමේ සංකල්පය හඳුන්වා දීම හා ඒ තුලින් වඩාත් ගුණාත්මක නිවසක හිමිකාරීත්වය වැවිලි ප්‍රජාව වෙත ලබා දීම.

## 7.4. වැවිලි ක්ෂේත්‍රයේ දරුවන් වෙත පෝෂණ අතිරේකයක් ලබා දීම

ජනාධිපති කාර්යාලය සමඟ සෞඛ්‍ය හා පෝෂණ ලේකම් කාර්යාලය එක්ව සකස් කරන ලද පෝෂණය සඳහා වන බහු ආංශික ජාතික ක්‍රියාකාරී සැලැස්ම (2017- 2020) මගින් මෙම අමාත්‍යාංශය වෙත පැවරී ඇති කාර්යභාරය අනුව යමින්, ළමා මන්දපෝෂණයේ ඉහළම දත්ත පිළිඹිඹු කෙරෙන වතු අංශයේ දරුවන්ගේ පෝෂණ තත්ත්වය නඟා සිටුවීම සඳහා වන දීර්ඝ කාලීන සැලැස්මක එක් පියවරක් ලෙස වැවිලි ක්ෂේත්‍රයේ අවුරුදු 3 - 5 වයසැති දරුවන් වෙත පෝෂණ අතිරේකයන් ලබා දීමේ වැඩ සටහන ආරම්භ කොට ක්‍රියාත්මක කිරීම.

## 7.5. හැටන්, පූල්බැන්ක් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය (PVTC) වැඩි දියුණු කිරීම.

වැවිලි ක්ෂේත්‍රයේ තරුණ තරුණියන් සඳහා කාලීන වෘත්තීය අධ්‍යාපනයක් හිමිකර දීමේ අභිලාෂයෙන් හැටන් පූල් බැන්ක් හි පිහිටි වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය වැඩි දියුණු කිරීම සඳහා ඉන්දීය රජයෙන් රු. මි. 199 ක ආධාර ලබා ගැනීම හා ඒ සඳහා ඉන්දීය රජය සමඟ ගිවිසුමකට එළඹීම.

# 08

# අමාත්‍යාංශය යටතේ ඇති ආයතන

## 8.1. වැවිලි මානව සංවර්ධන භාරය

### 8.1.1. පසුබිම

"වැවිලි මානව සංවර්ධන භාරය", වැවිලි අංශයේ වෙසෙන ජනතාවගේ ජීවනෝපාය මාර්ග වැඩි දියුණු කිරීම උදෙසා, 1982 අංක 17 දරණ සමාගම් පනත යටතේ, "වතු නිවාස හා සමාජ සංවර්ධන භාරය" නමින් 1992 සැප්තැම්බර් මස 18 වන දින ස්ථාපිත කරන ලද සමාගමකි.

1992 දී රජය ගත් ප්‍රතිපත්තිමය තීරණයකට අනුව ජනතා වතු සංවර්ධන මණ්ඩලයට සහ ශ්‍රී ලංකා වැවිලි සංස්ථාවට අයත් වතු පවරාගෙන එම වතුවල කළමණාකාරීත්වය ප්‍රාදේශීය වැවිලි සමාගම් 23ක් යටතේ පුද්ගලික අංශය වෙත පවරා දෙන ලදී. පෞද්ගලීකරණයෙන් කෙටි කලකට පසු, 2002 ඔක්තෝම්බර් මස 25 වන දින, ජනතා වතු සංවර්ධන මණ්ඩලය සහ ශ්‍රී ලංකා වැවිලි සංස්ථාවේ සමාජ අංශ ඒකාබද්ධ කරමින් වැවිලි අංශයේ වෙසෙන ජනතාවගේ සෞඛ්‍ය සහ අනෙකුත් සමාජ සුභසාධන කටයුතු මෙන්ම ජීවනෝපාය මාර්ග වැඩිදියුණු කිරීම උදෙසා "වතු නිවාස හා සමාජ සංවර්ධන භාරය", "වැවිලි මානව සංවර්ධන භාරය" ලෙස ප්‍රතිනාම ගත කරන ලදී. මේ වන විට මෙම භාරය 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ නැවත ලියාපදිංචි කර ඇත.

යථෝක්ත ඉලක්ක සාක්ෂාත් කරගනු පිණිස වැවිලි මානව සංවර්ධන භාරය මගින් පහත දැක්වෙන කටයුතු ක්‍රියාත්මක කරයි.

- වතු ප්‍රජාවේ පේළි නිවාස වෙනුවට ස්වයං අයිතිය සතු තනි නිවාස සුදුසු පුද්ගලයන් වෙත ලබාදීම.
- පැරණි පේළි නිවාස අලුත්වැඩියා කිරීම හා ඒවායේ වහල නැවත සෙවිළි කිරීම (re-roofing).
- ජල සම්පාදන හා සනීපාරක්ෂක පහසුකම් ප්‍රවර්ධනය කිරීම.
- ළමා සංවර්ධන මධ්‍යස්ථාන ස්ථාපිත කිරීම හා සුදුසුකම් ලත් ළමා සංවර්ධන නිලධාරීන් හඳුන්වා දීම.
- ප්‍රජා සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම (මාර්ග/ගොඩනැගිලි/ආගමික මධ්‍යස්ථාන යනාදිය)
- සෞඛ්‍ය පහසුකම් ලබාදීම හා සමාජ සංවර්ධන කටයුතු
- අලෙවි පහසුකම් සළසා දීම
- ජීවනෝපාය මාර්ග සඳහා පහසුකම් සළසා දීම


## 8.1.2. සංවිධාන ව්‍යුහය

"වැවිලි මානව සංවර්ධන භාරය", කඳුරට නව ගම්මාන, යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය යටතට පත් කරන ලද ආයතනයකි. මෙය, වැවිලි අංශයේ දස ලක්ෂයකට අධික ජනතාවකගේ ජීවන තත්ත්වය නගාසිටුවීම පිණිස වැඩසටහන් සම්බන්ධීකරණය කරමින්, ඊට අවශ්‍ය පහසුකම් සලසාදීම උදෙසා ක්‍රියාකරන, ශ්‍රී ලංකා රජය, ප්‍රාදේශීය වැවිලි සමාගම් සහ වතු අංශයේ වෘත්තීය සමිතිවලින් සමන්විත ත්‍රෛපාර්ශ්වික ආයතනයකි.

වතු කම්කරුවන්ගේ යහපත උදෙසා, පිහිටුවා ඇති මෙම ආයතනය, යටිතල පහසුකම් හා සමාජ සංවර්ධන වැඩසටහන් රැසක් මෙහෙයවීමෙහි ලා අදාළ අමාත්‍යාංශ, වෘත්තීය සමිති, ප්‍රාදේශීය වැවිලි සමාගම්, ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන හා වෙනත් දේශීය රාජ්‍ය නොවන සංවිධාන සහ රාජ්‍ය හා පුද්ගලික ආයතන සමග සහයෝගයෙන් කටයුතු කරයි.

එමෙන්ම, ගරු අමාත්‍යතුමා විසින් පත්කරනු ලබන සභාපතිවරයෙකු සහ ශ්‍රී ලංකා රජය, ප්‍රාදේශීය වැවිලි සමාගම් හා වෘත්තීය සමිති නියෝජිතයන්ගෙන් සමන්විත අධ්‍යක්ෂ මණ්ඩලයක් යටතේ වැවිලි මානව සංවර්ධන භාරය ක්‍රියාත්මක වේ. මෙහි ප්‍රධාන කාර්යාලය බත්තරමුල්ල, රොබට් ගුණවර්ධන මාවතේ පිහිටා ඇති අතර, අධ්‍යක්ෂ ජනරාල්වරයෙකුගේ මෙහෙයවීම යටතේ පවත්වාගෙන යනු ලැබේ. ගාල්ල, රත්නපුර, බදුල්ල, කෑගල්ල, මහනුවර, හැටන් සහ නුවරඑළිය යන ස්ථානවල පිහිටි ප්‍රාදේශීය කාර්යාල හතක් මගින් ප්‍රධාන කාර්යාලයේ කටයුතු ශක්තිමත් කෙරේ. ප්‍රාදේශීය අධ්‍යක්ෂකවරයා අදාළ ප්‍රාදේශීය කාර්යාලයේ ප්‍රධානියා වන අතර, තාක්ෂණික, මූල්‍ය හා කළමනාකරණ කාර්ය මණ්ඩලය ඔහුට සහාය සලසයි.

**වැවිලි මානව සංවර්ධන භාරයේ ප්‍රාදේශීය ව්‍යුහය.**



## 8.1.3. වැවිලි මානව සංවර්ධන භාරය හා සම්බන්ධිත ආයතන

### වතු සේවක නිවාස සමූපකාර සමිතිය

වතු සේවක නිවාස සමූපකාර සමිති, සමූපකාර දෙපාර්තමේන්තුව හා ඒකාබද්ධව 1993 දී පිහිටුවන ලදී. මූලික වශයෙන් නිවාස ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා පිහිටුවන ලද මෙම සමිති, මේ වනවිට ප්‍රාදේශීය වැවිලි සමාගම් මගින් පාලනය වන වතුයායවල් 435 ක් ආශ්‍රිතව ක්‍රියාත්මක වේ.

දැනට වතු සේවක නිවාස සමූපකාර සමිති 418 ක් දිවයින තුළ (ප්‍රාදේශීය වැවිලි සමාගම් සහ රජය විසින් පාලනය කරනු ලබන සමාගම් සම්බන්ධිතව) පිහිටුවා ඇත. දැඩි අනුග්‍රහයක් පවතින ප්‍රාදේශීය වැවිලි සමාගම් වල වතුයායවල් ආශ්‍රිතව පිහිටුවා ඇති මෙම සමූපකාර සමිති බොහොමයක්, ප්‍රමුඛ ප්‍රජා මූල සංවිධාන ලෙස රට තුළ ස්ථාපනය වී ඇත. ඒවා වැවිලි මානව සංවර්ධන භාරයේ ප්‍රාදේශීය කාර්යාල වල අධීක්ෂණය යටතේ නිර්ණායක මත පදනම් වූ ඉහළ ශ්‍රේණිගත කිරීම් වලට ලක් කර ඇති අතර, ඒවායේ නිරන්තර සුපරීක්ෂාවට භාජනය වේ.

මෙම සමිති, "වතු සේවක නිවාස සමූපකාර සමිති (වනිස) බැංකුව" යන නමින් ඔවුන්ගේම බැංකු හරහා සිය අරමුදල් උපදවාගනු ලබන අතර, ණය මුදල් සපයා දීමට ද කටයුතු කරයි.

ණය සැපයීමට අමතරව, රැකියා අවස්ථා ද උදා කරමින්, වතුවල පදිංචි නිවැසියන් හට ඔවුන්ගේ සේවා අවශ්‍යතා සඳහා පහසු ප්‍රවේශයක් සලසා දෙමින්, සමූපකාර සමිති, සිල්ලර භාණ්ඩ / ගෘහසාධන වෙළඳසැල්, බාබර් සැලුන් හා සන්නිවේදන මධ්‍යස්ථාන යනාදී ව්‍යාපාර ක්‍රියාත්මක කිරීමටද පහසුකම් සලසා ඇත. වතු නිවැසියන්ගේ ජීවන තත්ත්වය, ඔවුන්ගේ සෞඛ්‍ය, පෝෂණය, සනීපාරක්ෂාව හා පවිත්‍රතාව යනාදිය ඉහළ නැංවීම පිණිස ඔවුනට අවශ්‍ය වන භාණ්ඩ හා සේවා පහසුවෙන් ඔවුන් වෙත ළඟාකර දීම සඳහා, වතු සේවක නිවාස සමූපකාර සමිති තම උප නියෝජිතයන් ලෙස යොදාගනිමින් " වැවිලි මානව සංවර්ධන භාරය", බහු ජාතික සමාගම් සහ වෙනත් ප්‍රමුඛ පෞද්ගලික අංශයේ සංවිධාන සමග ද ඒකාබද්ධව කටයුතු කරයි.



## 8.1.4. වැවිලි මානව සංවර්ධන භාරය මගින් ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන්

### 8.1.4.1. මෙම අමාත්‍යාංශය ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන් / ව්‍යාපෘති

- **2017 නව නිවාස**

කඳුරට නව ගම්මාන යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය විසින් වතු ප්‍රජාව වෙත නිවාස 2,466 ක් ඉදිකර දීම සඳහා 2017 වසරේ දී රු.මි. 2000 ක ප්‍රතිපාදන වෙන් කර ඇති අතර එම නිවාස ඉදි කිරීම වැවිලි මානව සංවර්ධන භාරයේ ප්‍රාදේශීය කාර්යාල හරහා සිදු කෙරේ. 1993 සිට වැවිලි ප්‍රජාව සඳහා නිවාස ඉදි කිරීම වෙනුවෙන් වෙන් කරන ලද විශාලතම ප්‍රතිපාදන ප්‍රමාණය මෙය වන අතර 2017 සැප්තැම්බර් 30 වන විට ඉන් 30% ක (රු. මි. 550) පමණ ප්‍රතිපාදන වැවිලි මානව සංවර්ධන භාරය වෙත ලැබී ඇත.

ඊට අමතරව "ප්‍රතිලාභී මූලිකත්ව" නිවාස යෝජනා ක්‍රමය, අමාත්‍යාංශයේ ඍජු අධීක්ෂණය යටතේ වැවිලි මානව සංවර්ධන භාරය විසින් නුවරඑළිය ප්‍රදේශය හැර ඉතිරි ප්‍රදේශවල ක්‍රියාත්මක කරනු ලබයි. ඒ යටතේ නිවාස ඒකක 136 ක් ප්‍රතිලාභීන් විසින් ඉදිකරනු ලබයි.

- **ආපදා සහන නිවාස - 2017**

අමාත්‍යාංශය විසින් 2017 වසරේ දී ගාල්ල, හැටන්, රත්නපුර, බදුල්ල හා කෑගල්ල යන ප්‍රදේශයන්හී ස්වාභාවික විපත් වලට ලක් වීමෙන් වාසස්ථාන අහිමි වූ පවුල් සඳහා නිවාස ඒකක 406 ක් ලබාදීමට කටයුතු යොදා ඇත. එම නිවාස ඉදිකිරීම වැවිලි මානව සංවර්ධන භාරය විසින් සිදු කරනු ලබයි.

- **පේළි නිවාසයන්හි වහල නැවත සෙවිලි කිරීම**

නව නිවාස ඉදිකරන තෙක්, අතරමැදි පියවරක් වශයෙන්, පේළි නිවාසයන්හි දිරාපත් වූ වහල නැවත සෙවිලි කිරීමේ වැඩසටහන ක්‍රියාත්මක වන අතර වැවිලි මානව සංවර්ධන භාර ප්‍රදේශ 07 තුල හඳුනාගත් පේලි නිවාස ඒකක 452 ක් වහල නැවත සෙවිලි කිරීම සඳහා රු.මි. 26 ක ප්‍රතිපාදන මේ වනවිට අමාත්‍යාංශය විසින් ලබා දී ඇත. එමෙන්ම, අමතර නිවාස ඒකක 872 ක් සඳහා අනුමැතිය හිමි වී ඇත.

- **සනීපාරක්ෂක පහසුකම් සැපයීම**

වැවිලි මානව සංවර්ධන භාරය මගින් සනීපාරක්ෂක ව්‍යාපෘති 489 ක් මෙම වර්ෂය තුල ක්‍රියාත්මක කරන අතර, ඒ සඳහා දැනට රු.මි. 29 ක ප්‍රතිපාදන අමාත්‍යාංශය විසින් ලබා දී ඇත.

- **විශේෂ ව්‍යාපෘති - 2017**

මීට අමතරව, විශේෂ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා රු.මි. 225 ට අධික මුදල් ප්‍රමාණයක් වෙන් කර ඇත. විවිධ ඉදිකිරීම්, දැනුවත් කිරීම්, පුහුණු වැඩ සටහන් රාශියක් ද එයට ඇතුලත්ය.

- **පෝෂණ අතිරේකය**



වතු අංශයේ ළමා මන්දපෝෂණය අවම කිරීම සඳහා අමාත්‍යාංශය විසින් හඳුන්වා දුන් පෝෂණ වැඩසටහන "වැවිලි මානව සංවර්ධන භාරය" හරහා ක්‍රියාත්මක වන අතර මේ දක්වා වැයකර ඇති මුදල රු.මි. 15 කි.

### 8.1.4.2. අනෙකුත් ආයතනයන්හි ප්‍රතිපාදන මත ක්‍රියාත්මක කරන වැඩසටහන්

- **පූර්ව ළමා විය සංවර්ධන වැඩසටහන**

ලෝක බැංකු ආධාර යටතේ කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය හා එක්ව පූර්ව ළමාවිය සංවර්ධනය සඳහා වන පස් අවුරුදු ව්‍යාපෘතියක් ආරම්භ කර ඇති අතර, එහි සමස්ත ආයෝජනය ඇ.ඩො.මි.10 ක් වේ. වැවිලි ප්‍රදේශ වල ජීවත් වන වයස අවුරුදු 3 - 5 අතර දරු දැරියන්ගේ ළමා සංවර්ධන කටයුතු ප්‍රමාණාත්මකව හා ගුණාත්මකව වැඩි දියුණු කිරීම මෙහි අරමුණ වන අතර, මෙය වසර 2020 දී නිම කිරීමට නියමිතය.

මේ යටතේ ගොඩනැගිලි, ක්‍රීඩා පිටි සහ උපකරණ ද සහිතව ඉදි කිරීමට අපේක්ෂිත නව ළමා සංවර්ධන මධ්‍යස්ථාන සංඛ්‍යාව 140 ක් වන අතර, දැනටමත් වැවිලි ප්‍රදේශ තුල ඇති වැඩි දියුණු කිරීමට නියමිත ළමා සංවර්ධන මධ්‍යස්ථාන සංඛ්‍යාව 175 කි. එමෙන්ම අවශ්‍ය උපකරණ ද සහිතව නව ක්‍රීඩා පිටි 175 ක් ඉදි වන අතර දැනට ඉදි කර ඇති ක්‍රීඩා පිටි 210 ක් නවීකරණය සිදු කෙරේ. එමෙන්ම ළමා සංවර්ධන මධ්‍යස්ථානවල ගුරුවරුන්/ සහායකයින් සඳහා අවශ්‍ය පුහුණුවීම් ලබා දීම ද, දෙමාපියන් දැනුවත් කිරීමේ වැඩසටහන්ද මෙයට ඇතුලත් වේ.

මෙම ව්‍යාපෘතිය යටතේ, 2016 වසර තුල වැවිලි ප්‍රදේශ හතක් තුල නව ළමා සංවර්ධන මධ්‍යස්ථාන 28

ක් ඉදිකිරීමට හා  මධ්‍යස්ථාන 35 ක් වැඩි දියුණු කිරීමට අවශ්‍ය මූලික කටයුතු අරඹා ඇති අතර ක්‍රීඩාපිටි 42 ක් ද ඉදිකිරීමට නියමිතය. ළමා සංවර්ධන නිලධාරීන් 206 දෙනෙකු සඳහා පුහුණු වැඩසටහන් පවත්වා ඇත. එමෙන්ම, ප්‍රථම වතාවට ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව හා එක්ව පෙර පාසැල් ගුරුවරුන් හා ළමා සංවර්ධන මධ්‍යස්ථාන පිළිබඳ සංගණනයක් ද සිදු කිරීමට කටයුතු කෙරේ.

### • ජල සම්පාදන හා සනීපාරක්ෂක පහසුකම් වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය

ලෝක බැංකු ආධාර යටතේ, නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශය හා එක්ව වැවිලි මානව සංවර්ධන භාරය විසින්  නුවරඑළිය සහ හැටන්හි තෝරාගත් ප්‍රදේශවල ගෘහ ඒකක 15,800 ක් ඉලක්ක කොට ගනිමින් ග්‍රාමීය ජල  සම්පාදන ව්‍යාපෘතීන් 130 ක් ද,ගෘහ ඒකක 7,300 ක් ඉලක්ක කොට ගනිමින් වැසිකිළිද ඉදි කිරීමට නියමිතය.මෙම ව්‍යාපෘතියේ  සමස්ත පිරිවැය ඇ. ඩො. මි. 14 ක් වන අතර, මෙය වසර 2020 දී නිම කිරීමට නියමිතය.

2017 වසරේදී ජල සම්පාදන ව්‍යාපෘතීන් 12 ක් ආරම්භ කර ඇති අතර ප්‍රසම්පාදන කටයුතු සිදු කෙරෙමින් පවතී. ආරම්භ කර ඇති වැසිකිළි ව්‍යාපෘති 2,292 කින්, 270 ක් අවසන් කර ඇති අතර ඉතිරි ව්‍යාපෘති ක්‍රියාත්මක වෙමින් පවතී.









## 8.2. ප්‍රජාශක්ති මෙහෙයුම් ඒකකය

ප්‍රජා ශක්ති මෙහෙයුම් ඒකකය මගින් පවත්වාගෙන යනු ලැබූ හැටන් පුල්බෑන්ක් හි පිහිටි වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය, රම්බොඩ සංස්කෘතික මධ්‍යස්ථානය, නෝර්වුඩ් හි පිහිටි ක්‍රීඩා සංකීර්ණය හා ප්‍රජාශක්ති මධ්‍යස්ථානයන්, 2016.07.02 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශය මගින් අමාත්‍යාංශයේ සෘජු අධීක්ෂණය යටතට පවරාගනු ලැබින.

ඒ අනුව කොල්ලුපිටිය ශාන්ත මයිකල් පාර අංක 45, දරන ස්ථානයෙහි පිහිටා ඇති මෙම අමාත්‍යාංශ පරිශ්‍රයෙහි ප්‍රජාශක්ති මෙහෙයුම් ඒකකයේ ප්‍රධාන කාර්යාලය පිහිටුවා ඇති අතර, එමගින් අමාත්‍යාංශයේ සෘජු අධීක්ෂණය මත, ඉහත ආයතන 4 හි ක්‍රියාකාරීත්වය පවත්වාගෙන යනු ලැබේ.

### 8.2.1. ප්‍රජාශක්ති (E- KIOSK) සංවර්ධන ව්‍යාපෘතිය

තොරතුරු සන්නිවේදන තාක්ෂණය පෘථුල ලෙස භාවිතා කරමින් අඩු වරප්‍රසාද ලත් ජන කොටස් වෙත පූර්ණවූත්, විස්තීර්ණවූත් සමාජ ආර්ථික සංවර්ධනයක් හිමිකරදීම මෙම ව්‍යාපෘතියේ අභිලාෂය වේ. වතු ප්‍රදේශ ආවරණය කරමින් ප්‍රජාශක්ති මධ්‍යස්ථාන 44 ක් හරහා මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වේ.

ග්‍රාමීය හා වතු ප්‍රදේශයන්හි පළමු වසරේ සිට උසස් අධ්‍යාපනය හදාරන ශිෂ්‍ය - ශිෂ්‍යාවන්ටද පාසල් හැර ගිය තරුණ - තරුණියන්ටද පරිඝණක අධ්‍යාපනය ලබා දීමේ කේන්ද්‍රස්ථානය වශයෙන් ප්‍රජාශක්ති මධ්‍යස්ථාන ක්‍රියා කරනු ලබයි. එසේම අධ්‍යාපනික අරමුණු සඳහා අන්තර්ජාල පහසුකම් අවශ්‍ය වන්නන් සඳහා නොමිලේ එම පහසුකම් ලබා දීමටද, පුස්තකාල පහසුකම් සැපයීම තුලින් ඔවුන්ගේ කියවීම හා දැනුම වර්ධනයටද, කවි නාට්‍ය හා කථික තරඟ තුලින් පෞරුෂත්ව සංවර්ධනයටද මෙම මධ්‍යස්ථානය හරහා පහසුකම් සලසා තිබේ.

ශ්‍රී ලංකාවේ විරැකියාව හා ඌන රැකියා නියුක්තියේ ඉහලම අගය වැවිලි ප්‍රදේශ වලින් පෙන්නුම් කෙරෙන අතර, මෙම තත්ත්වය මඟ හැරවීම පිණිස, වැවිලි ප්‍රදේශ ඉලක්ක කොට ගනිමින් අමාත්‍යාංශ ප්‍රතිපාදන මත, තරුණයන් බලගැන්වීම සඳහා විශේෂ වැඩසටහනක් ක්‍රියාත්මක කෙරෙන අතර, එමගින් රැකියා වෙළඳපොලට ප්‍රවේශ වීම සඳහාත්, ස්වයං රැකියා අවස්ථා බිහිකරලීමටත් අවශ්‍ය මාර්ගෝපදේශකත්වය ලබා දෙනු ලැබේ.

### 2017 - විශේෂ ව්‍යාපෘති - කාන්තාවන් බල ගැන්වීම - පුහුණු වැඩසටහන

සමාජ, ආර්ථික හා දේශපාලනික සන්දර්භයන් තුල වැවිලි කාන්තාවන්ගේ නියෝජනය ඉහල නැංවීම සඳහා කාන්තාවන් බලාත්මක කිරීමට අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මත ප්‍රජා ශක්ති මධ්‍යස්ථාන හරහා විශේෂිත වැඩසටහන් මාලාවක් ක්‍රියාත්මක කිරීමට කටයුතු යොදා ඇති අතර එමගින් කාන්තා සංවිධාන ශක්තිමත් කරමින් නව ආදායම් උත්පාදන මාර්ග ඇති කර ගැනීමට අවශ්‍ය වෘත්තීය මාර්ගෝපදේශකත්වය සැපයීම ද සිදු කෙරේ. මේ පිළිබඳව දැනුවත් කිරීම සඳහා ක්‍රියාකාරී සාමාජිකයන් 500 කට අධික ප්‍රමාණයක් ඉලක්ක කර ගනිමින් වැඩසටහන් 14 ක් මේ වන විට පවත්වා ඇති අතර ඉදිරියේදී තවත් වැඩසටහන් රාශියක් ද පැවැත්වීමට නියමිතය.

### 8.2.2. වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය - පූල් බෑන්ක්, හැටන්

වෘත්තීය පුහුණු අධිකාරිය යටතේ පවත්වාගෙන යනු ලැබූ මෙම පුහුණු මධ්‍යස්ථානය 2007 වසරේදී සෞම්‍යමූර්ති තොණ්ඩමාන් අනුස්මරණ පදනම යටතටත්, අනතුරුව 2016 වසරේදී මෙම අමාත්‍යාංශයේ සෘජු අධීක්ෂණයටත් පත් කරන ලදී.

ඉන්දියානු රජයේ ආධාර යටතේ වෘත්තීය පුහුණු විශේෂඥ උපදේශකවරුන් 07 දෙනෙකුගේ සේවය මෙම ආයතනය වෙත ලැබුන අතර 2017 වසරේ සැප්තැම්බර් මස වනවිට කොන්ත්‍රාත් කාලය සම්පූර්ණ වීම

හේතුවෙන් ඔවුන්ගේ සේවය අවසන් වී ඇත. මේ වන විට වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය හරහා වෘත්තීය පුහුණු පාඨමාලා 12 ක් ක්‍රියාත්මක කරන අතර අවශ්‍ය ප්‍රතිපාදන අමාත්‍යාංශය මගින් සපයනු ලබයි.

මීට අමතරව අ.පො.ස. (උ/පෙළ) ඉංජිනේරු තාක්ෂණ විෂයය හදාරන සිසුන් සඳහා දෙමළ මාධ්‍යයෙන් අමතර පන්ති පැවැත්වීමක් සිදු කරන අතර, ඒ සඳහා බදුල්ල, මාතලේ, කොටගල හා පුස්සැල්ලාව වැනි විවිධ ප්‍රදේශ වලින් සිසුන් සහභාගී වේ.

ඉන්දියානු රජයේ ආධාර යටතේ පූල් බෑන්ක් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය සංවර්ධනය කිරීම සඳහා ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය හා ශ්‍රී ලංකා රජය නියෝජනය කරමින් මෙම අමාත්‍යාංශය 2017.09.20 දින අවබෝධතා ගිවිසුමකට එළඹී අතර, ඉන්දියානු රජයේ ආධාර යටතේ රු. මිලියන 199 ක් වැය කර එහි ගොඩනැගිලි නවීකරණයත්, වාහන යන්ත්‍රෝපකරණ හා අදාල අනෙකුත් උපාංග මිලදී ගැනීමටත් නියමිතය.

වසරකට සිසුන් 400 ක් පුහුණු කිරීම් සඳහා පහසුකම් මෙම ස්ථානය සතුව ඇති අතර 2017 වසර තුළදී පාඨමාලා 12 ක් යටතේ සිසුන් 335 ක් ලියා පදිංචි වී ඇත. එහිදී මෝටර් කාර්මික පාඨමාලාව සම්පූර්ණ කරන ලද සිසුන් විසින් මෝටර් රථයක් එකලාංග (Essembling) කිරීම සුවිශේෂිත ජයග්‍රහණයක් ලෙසට හැඳින්විය හැක.

**වගුව15 : 2017 වසරේ පූල් බෑන්ක් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය යටතේ විවිධ පාඨමාලා සඳහා සිසුන් ලියාපදිංචි වීම පිළිබඳ විස්තර**

| අනු | පාඨමාලාව | ලියාපදිංචිය | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | මාර්තු - දෙසැම්බර් 2017 | | | මාර්තු - ජූනි 2017 | | | ජූලි - දෙසැම්බර් 2017 | | |
| | | පි | ගැ | එ | පි | ගැ | එ | පි | ගැ | එ |
| 1 | මෝටර් කාර්මික | 20 | - | **20** | - | - | - | - | - | - |
| 2 | විදුලි කාර්මික | 20 | - | **20** | - | - | - | - | - | - |
| 3 | කාර්මික ශිල්පී | 14 | - | **14** | - | - | - | - | - | - |
| 4 | ගුවන් විදුලි රූපවාහිනී අලුත්වැඩියාව | 7 | 1 | 8 | - | - | - | - | - | - |
| 5 | ඇලුමිනියම් ෆැබ්රිකේටර් | - | - | - | 15 | - | **15** | 18 | - | **18** |
| 6 | ඇඳුම් මැසීම | - | - | - | - | 29 | **29** | - | 26 | **26** |
| 7 | ගෘහස්ථ විදුලි කාර්මික | - | - | - | 6 | 4 | **10** | 10 | 2 | **12** |
| 8 | හෝටල් කළමනාකරණය | - | - | - | 12 | 12 | **24** | 11 | 4 | **15** |
| 9 | තොරතුරු සන්නිවේදන හා තාක්ෂණය | - | - | - | 13 | 13 | **26** | 5 | 14 | **19** |
| 10 | මෝටර් සයිකල් කාර්මික | - | - | - | 20 | - | **20** | 17 | - | **17** |
| 11 | පැස්සුම් ශිල්පය | - | - | - | 13 | - | **13** | 11 | - | **11** |
| 12 | වඩු කාර්මික | - | - | - | 11 | - | **11** | 7 | - | **7** |
| | එකතුව | 61 | 1 | **62** | 90 | 58 | **148** | 79 | 46 | **125** |

## 8.2.3. රම්බොඩ සංස්කෘතික මධ්‍යස්ථානය

අඩු පහසුකම් සහිත ප්‍රජාවගේ සංස්කෘතික අභිමතාර්ථයන් හා පිළිවෙත් වර්ධනය කිරීමේ අදහසින් මෙම මධ්‍යස්ථානය පිහිටුවා ඇත. 2009 වසරේදී සිට කර්නාටක සංගීතය, වීනා වාදනය, තබ්ලා හා වයලීන් වාදනය පිළිබඳව ආචාර්යවරයකුගේ පූර්ණ කාලීන අධීක්ෂණය යටතේ පාඨමාලා පැවැත්වේ. පුහුණු වැඩසටහන් දියත් කිරීම සඳහා මෙම මධ්‍යස්ථාන, විශ්වවිද්‍යාලයක් හා ඒකාබද්ධ කිරීමට අවශ්‍ය පියවරයන් ගනිමින් පවතී. අමතර ආදායම් මාර්ග ලෙස, උත්සව පැවැත්වීමට හා සංස්කෘතික වැඩසටහන් සඳහා පහසුකම් සැපයීමද මෙමගින් සිදු කෙරේ.

## 8.2.4. නෝර්වුඩ්හි පිහිටි ක්‍රීඩා සංකීර්ණය - නෝර්වුඩ්

මෙම අමාත්‍යාංශයේ සෘජු පාලනය යටතේ මෙම ආයතනය පවත්වාගෙන යනු ලැබේ. ශ්‍රී ලංකා පාපන්දු සම්මේලනය මගින් 2011 වසරේදී රු: මි. 25 ක මුදලක් වැය කර ක්‍රීඩා පිටිය සංවර්ධනය කර ඇත.

අමාත්‍යාංශ ප්‍රතිපාදන යටතේ 2017 වසරේ දී එහි ඇතැම් සංවර්ධන කටයුතු සිදුකර ඇති අතර, අවට පාසල් හා රාජ්‍ය ආයතන රාශියක් විවිධ ක්‍රීඩා තරග හා ක්‍රියාකාරකම් පැවැත්වීම සඳහා මෙම ක්‍රීඩා සංකීර්ණය යොදා ගනු ලැබේ.













# 09

## අමාත්‍යාංශයේ අපේක්ෂා හා 2018 ආයෝජනය

වැවිලි ප්‍රජාවගේ සමාජ ආර්ථික සංවර්ධනය සඳහා සකස් කරන ලද පස් අවුරුදු ජාතික ක්‍රියාකාරී සැලැස්මෙහි ඉලක්ක කොට ඇති දර්ශක සපුරා ගැනීමේ අභිප්‍රායෙන් අමාත්‍යාංශයේ 2018 අයවැය ඇස්තමේන්තුව සකස් කර ඇති අතර ජාතික ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීමේ පාර්ශ්වකාර අමාත්‍යාංශ, ආයතන සම්බන්ධීකරණය කරමින් එම ආයතනයන්ද ක්‍රියාකාරී සැලැස්මෙහි දක්වා ඇති ඉලක්ක වෙත ළඟා කරවීම සඳහා අමාත්‍යාංශය දැඩි ප්‍රයත්නයක් දරමින් සිටී.

නායයාම් වලට වැඩි අවදානමක් පවතින ප්‍රදේශවල ජීවත් වන වැවිලි ප්‍රජාව වෙත විශේෂ අවධානයක් යොමු කරමින්, ජාතික ක්‍රියාකාරී සැලැස්මෙහි (2016 - 2020) අපේක්ෂා කරනු ලබන නිවාස ඒකක 56,500ක ඉලක්කය සපුරා ගැනීම සඳහා 2018 වසර තුලදී නව නිවාස ඒකක 7,000 ක් පමණ ඉදිකිරීමටත් 2017 අවිච්ඡේද වන නිවාසයන්හී වැඩ කටයුතු මුළුමනින්ම නිම කිරීමටත් අපේක්ෂ කරන අතර එකී නිවාස යෝජනා ක්‍රම සඳහා අවශ්‍ය විදුලිය, ජලය, සනීපාරක්ෂක පහසුකම් ලබා දීමටත් හඳුනාගත් පසුගාමී ප්‍රදේශයන්හී ජල, විදුලි හා සනීපාරක්ෂක පහසුකම් වැඩි දියුණු කිරීමටත් ක්‍රියාකරනු ලැබේ.

රජයේ ඒකාබද්ධ අරමුදල යටතේ ඉදිකරන නිවාස ප්‍රමාණයට අමතරව, ඉන්දියානු ආධාර යටතේ නව නිවාස 10,000 ක් ලබා දීම සඳහා ඉන්දීය අග්‍රාමාත්‍යතුමාගේ පසුගිය ශ්‍රී ලංකා සංචාරයේදී එකඟතාවය ලැබී ඇත.

ජාතික ක්‍රියාකාරී සැලැස්ම මගින් හඳුනාගත් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රමානවත් ප්‍රතිපාදන නොමැති බැවින් අවශ්‍ය අරමුදල් සපයා ගැනීමට අමාත්‍යාංශය විදේශ සමුළුවක් පැවැත්වීමට (Donor forum) කටයුතු යොදා ඇති අතර පාර්ශ්වකාර ආයතන විසින් සිය ව්‍යාපෘති සැලසුම් ඉදිරිපත් කිරීමට එය අවස්ථාවක් කර ගනු ඇත.

කොන්ත්‍රාත් මූලික ඉදිකිරීම් ක්‍රමයෙහි පවතින අඩුපාඩු අවම කොට ඉදිකිරීම් කටයුතු කඩිනම් කිරීම සඳහා නව සංකල්පයන් වෙත අවධානයන් යොමු කර ඇති අතර ඒ යටතේ ප්‍රතිලාභී මූලිකත්ව, රාජ්‍ය පෞද්ගලික හවුල්කාරීත්වය, පෙර සවි ආකෘති නිවාස (Precast / Panel) යනාදිය හඳුන්වා දී ඇත. එහි සාර්ථකත්වය අනුව 2018 දී එම ක්‍රමයන් තව දුරටත් ව්‍යාප්ත කිරීමට අපේක්ෂිතය.

වැවිලි ප්‍රජාවගේ ජීවනෝපාය හා පෝෂණ තත්ත්වය ඉහළ නැංවීම සඳහා ක්‍රියාත්මක කරන මත්පැන් භාවිතය අවම කිරීම, වකුගඩු රෝග නිවාරණය, පෝෂණ වැඩමුළු හා පරිසර සංරක්ෂණ වැඩසටහන් 2018 දී ද අඛණ්ඩව ක්‍රියාත්මක කරන අතර 2017 වසරේ ඇරඹි දිළිඳුකම දුරලීමේ වැඩසටහනද ඊට අයත්ය.

වතු දරුවන්ගේ මන්දපෝෂණය වැලැක්වීමට වයස අවුරුදු 3 - 5 අතර දරුවන් සඳහා පෝෂණ අතිරේකයක් ලබා දීම නියමු ව්‍යාපෘතියක් ලෙසට මෙම වසරේදී ආරම්භ කළ අතර එය 2018 දක්වා ක්‍රියාත්මක කිරීමටත් ප්‍රගතිය මත අඛණ්ඩව පවත්වාගෙන යාමටත් අපේක්ෂා කෙරේ.

නුපුහුනු ශ්‍රමිකයන්ගේ සංක්‍රමණය වැලැක්වීමට හා රැකියා වෙළඳපොළ ඉල්ලුමට සරිලන ශ්‍රමිකයන් බිහි කිරීම අරමුණු කොට හැටන්හි පිහිටි පුල් බැන්ක් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය නවීකරණය කෙරෙන අතර ඊට අවශ්‍ය නව තාක්ෂණය ලබා දීමත්, නව පාඨමාලා හඳුන්වා දීමත්, අනෙකුත් පහසුකම් ලබා දීමත් ඉන්දියානු රජයේ ආධාර මත සිදු කෙරේ.

වැවිලි ප්‍රජාවගේ ඉඩම් හිමිකම සනාථ කරමින් ''නිරවුල් ඔප්පු ප්‍රදානය'' 2018 වර්ෂයේදී ද ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත අතර නිරවුල් ඔප්පු 6,624 ක් නිවාසලාභීන්ට ලබා දීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය මේ වන විට ලැබී ඇත.

වැවිලි ප්‍රජාවගේ සමාජ සංවර්ධන ඉලක්ක අත් පත් කර ගැනීමේ ප්‍රධාන අභියෝගයක්ව පවතින සමාජ ආර්ථික දත්ත හා තොරතුරු හිඟ කම හේතුවෙන් ජාතික ක්‍රියාකාරී සැලැස්මේද දක්වා ඇති පරිදි භූ විද්‍යාත්මක තොරතුරු ආශ්‍රිත සිතියම් පද්ධතියක්ද සමඟ දත්ත පද්ධතියක් 2018 වර්ෂයේදී සකස් කිරීම සඳහා අමාත්‍යාංශය කටයුතු යොදා ඇත.

# 10

# අමාත්‍යාංශයේ සංවර්ධන ක්‍රියාකාරකම්
























වැවිලි ප්‍රජාව මෙතෙක් මුහුණ දුන් සමාජ විෂමතාවන් තුරන්කොට, ඔවුන් අභිමානවත් ග්‍රාමීය ප්‍රජාවක් ලෙස පරිණාමනය කිරීමේ අරමුණින් ආරම්භ කළ කඳුරට නව ගම්මාන, යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය, වැවිලි ප්‍රදේශ කේන්ද්‍රගත කර ගනිමින් ජීවත්වන මිලියනයකට අධික වැවිලි ප්‍රජාවගේ සමාජ, ආර්ථික සංවර්ධනය නිසි දිශානතියක් ඔස්සේ මනා අධීක්ෂණයකින් යුතුව ක්‍රියාත්මක කිරීම සඳහා අවතීර්ණ වී ඇත.

பெருந்தோட்ட மக்கள் இதுவரை முகம்கொடுத்து வந்த சமூக முரண்பாடுகளை நீக்கி அவர்களை கௌரவமான கிராமிய சமூகமாக பரினமிக்கச் செய்யும் நோக்குடன் மலைநாட்டு புதிய கிராமங்கள் உட்கட்டமைப்பு மற்றும் சமுதாய அபிவிருத்தி அமைச்சு பெருந்தோட்ட பகுதிகளை மையமாகக் கொண்டு வாழ்ந்து வருகின்ற ஒரு மில்லியனுக்கும் மேற்பட்ட மக்களது சமூக, பொருளாதார அபிவிருத்தியை முறையான திசைமுகப்படுத்தலின் ஊடாகவும் சிறந்த மேற்பார்வையுடனும் மேற்கொள்ளும் பொருட்டு ஆரம்பிக்கப்பட்ள்ளது.

The Ministry of Hill Country New Villages, Infrastructure and Community Development was established with the intention of transforming the plantation community with dignity, by removing the social disparities they face, into a village community, giving proper direction for implementation & focusing on upliftment of the socio economic status of over one million population living in plantation areas.

**කඳුරට නව ගම්මාන, යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය**

மலைநாட்டு புதிய கிராமங்கள், உட்கட்டமைப்பு மற்றும் சமூக அபிவிருத்தி அமைச்சு

**Ministry of Hill Country New Villages, Infrastructure and Community Development**